ස්තුතිය

පර්යේෂණ කටයුතු සඳහා අරමුදල් ලබාදීම, පර්යේෂණ කාර්ය මණ්ඩලය හුවමාරු කිරීම සහ පුහුණු කිරීමේලා පහසුකම් සැළසීම යනාදිය සිදුකළා වූ ආයතන හා විදේශීය රාජ්‍යයන්ටත් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයටත් මෙම මධ්‍යස්ථානය සිය ස්තුතිය පිරිනමන අතර, ඔවුන් දැක්වූ සහයෝගය පිළිබඳ කෘතඥතාවය ද මෙහිලා සඳහන් කරමි.

මෙම මධ්‍යස්ථානයේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා ඊට නන් අයුරින් සහයෝගය දැක්වූ, ආධාර කලා වූ සමස්ථ කාර්ය මණ්ඩලයටත්, සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය මෙයින් පිරිනැමේ.

ප්‍රෂාන්ත විතාන
වැ.බ. සභාපති

පටුන

01	පනත්, නීති හා වස්ථාපිත පාලනය	02
02	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ	03-05
03	ආයතනික වටිනාකම්	06-07
04	අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය	08-09
05	සභාපතිතුමාගේ පණිවුඩය	10-11
06	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය	12-15
07	මානව සම්පත් කළමනාකරණය	16-21
08	2019 වසරේ කාර්යසාධනය පිළිබිඹු කිරීම	22-29
09	2019 වසරේදී ලබගත් සම්මාන හා ජයග්‍රහණ	30-31
10	සුභසාධන හා ආගමික කටයුතු	32-33
11	**2019 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාලෝචනය**	34-50
	11.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති	
	11.2 2019.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය (අගය - රුපියල්)	
	11.3 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාඩී පඳනම මත විඳහාපෑම	
	11.4 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	
	11.5 2019.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය	
	11.6 2019.12.31 දිනට ගිණුම්කරන සටහන්	
12	2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	51-56
13	විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම්	57



1

පනත්, නීති හා වස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 වර්ෂයේදී පිහිටුවන ලද අතර වර්තමානයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශීය කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව හා ප්‍රගමනය උදෙසා ව්‍යවස්ථාපිත පනතේ අරමුණු පෙරදැරිව ආයතනයේ කාර්යභාරය ඉටුකරනු ලබන අතර ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුළ පිහිටුවා ඇත.

කාර්යාලීය ලිපිනය

2සී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

ඇමතුම් විස්තර

+ 94-011-2236284
+ 94-011-2236384
+ 94-011-2236307
+ 94-011-5354597

+ 94-011-2233153

nerdcentre@nerdc.lk

බැංකු කරුවෝ

ලංකා බැංකුව - ජා ඇල
ලංකා බැංකුව - ආයතනික ශාඛාව

විගණකවරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව



2

දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ



දැක්ම



මෙහෙවර

"නව නිපැයුම් සහ ආයතනයේ කාර්ය මණ්ඩලය මෙන්ම ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ගේ නිර්මාණශීලීත්වය පවුර්ධනය වන සංස්කෘතියක් ආයතනය තුළ ඇති කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා සෘජුව බලපෑමක් කළහැකි ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරමින් ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය, අත්පත් කරගැනීම, භාවිතා කිරීම හා පැවරීම"

අභිමතාර්ථය

"ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වන ඉංජිනේරුමය මැදිහත්වීම."

අරමුණු

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ පත්‍රිපාදන අනුව 1974 අගොස්තු 14 වන දින පහත සඳහන් අරමුණු පෙරදැරිව පිහිටුවා ඇත.

1. ශ්‍රී ලංකාවේ නව සොයාගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික කම්‍ර ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

2. සාමූහික ප්‍රයත්නයන් ඵලදායී අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළස්වීම.

3. රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම

4. අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

5. උචිත තාක්ෂණික ශිල්පීය කම්‍ර වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජණය අත්කර ගැනීමට අනුබල දීම.

6. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබුවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

7. ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණානයනය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

8. රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අබන්ධ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

9. ඉහත කී කරුණු වලට අදාළ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ සම්බන්ධ කාර්යයන් සඳහා විධිවිධාන සැලැස්වීම.



3

ආයතනික වටිනාකම්



සමාජීය යහපැවැත්මට දායක වන ගුණාත්මක නිෂ්පාදන, තාක්ෂණයන් සහ සේවාවන් සැපයීම සඳහා නර්ඩ ආයතනයේ අපි කැපවී සිටිමු. අපගේ පුද්ගලික සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන් අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. එනිසා, ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධනයෙහි විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති ඉහළ කාර්යසාධන සංස්කෘතියක්, අපගේ කාර්යමණ්ඩලය, ගනුදෙනුකරුවන්, අනෙකුත් පාර්ශවකරුවන් සහ ප්‍රජාව කෙරෙහි නර්ඩ ආයතනය කැපවීමේ මූලික වටිනාකම් වනුයේ


පාර්ශවකරුවන් සහ ප්‍රජාව
• තිරසාර සංවර්ධනය
• සමාජීය වගකීම් දැරීම
• අගයන් එකතුකිරීම සඳහා කැපවීම
ඒජන්සියේ ගණුදෙනුකරුවන්
• පාරිභෝගික තෘප්තිය සඳහා වූ ගුණාත්මක හා කාලානුරූපී වූ නිෂ්පාදන, තාක්ෂණය සහ සේවාවන් සැපයීම
• ශක්තිමත් අන්තර් සබඳතාවන් පවත්වාගැනීම
• පාරිභෝගික ගෞරවය, ආචාරශීලීත්වය සහ සාධාරණත්වය
ඒජන්සියේ කාර්යමණ්ඩලය
• නිර්මාණශීලීත්වය, නවතාවය සහ විවෘතභාවය
• අඛණ්ඩ අධ්‍යනය හා සංවර්ධනය තුළින් වෘත්තීය ඉලක්ක සාධනය කිරීම
• ධනාත්මක කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියාකිරීම
• ඉහළ කාර්යසාධනය සහ ඉගෙනුම් සංස්කෘතිය
• වෘත්තීයභාවය, විවෘතභාවය සහ වගවීම



4

අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය

සභාපති

ඉංජි. සී.එම්. දෙල්පචිත්‍ර මයා (2019.02.08 සිට 2019.09.17 දක්වා)
B Sc (Eng), C.Eng., MIE(Z)

වැ.බ. සභාපති

ප්‍රශාන්ත විතාන මයා (2019.09.17 සිට 2019.12.04 දක්වා)
MBA

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2019

1. **එච්.එම්. සිද්ධීක් මයා**
   LL.B, Attorney- at-Law
   (2019.02.08 සිට)
2. **එස්. සුරේශ් සී ප්‍රනාන්දු මයා**
   (2019.02.08 සිට)
3. **ප්‍රශාන්ත විතාන මයා**
   MBA
   (2019.02.08 සිට 2019.02.09.16 දක්වා)
4. **ආර්. ද ලිවේරා මයා**
   (2019.02.08 සිට)
5. **නිලූකා කුමාරි මීය**
   Master of Business Studies, CBA
   (2019.02.14 සිට 2019.09.02 දක්වා)
6. **හේමන්ත පුබුදුසිරි මයා**
   (2019.09.03 සිට)

අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng. (Energy Technology), B Sc Eng. (Hons), C Eng., MIE (SL)


ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
සංවිධාන ව්‍යුහය (අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව)
සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)
අධ්‍යක්ෂ මානව සම්පත්
අධ්‍යක්ෂ මූල්‍ය
අධ්‍යක්ෂ තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ තාක්ෂණික
සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන දෙපාර්තමේන්තුව
බලශක්ති හා පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව
මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
ගණකාධිකාරී
ජාල කළමනාකරු
සහකාර අධ්‍යක්ෂ (අලෙවි)
ගෘහ නිර්මාණ ශිල්පී
ඉංජිනේරු (නඩත්තු)
පුස්තකාලයාධිපති
පරිපාලන නිලධාරී
සැපයුම් නිලධාරී
පාලක (කෞතුකාගාරය)
පාලක (තාක්ෂණ උද්‍යානය)
අලෙවි නිලධාරී
තාක්ෂණ නිලධාරී
තාක්ෂණ නිලධාරී
පාලක (නඩත්තු)
පාලක (වැඩහල)
තාක්ෂණ නිලධාරී
තාක්ෂණ නිලධාරී
රහස්‍ය ලේකම්
කාර්මික සහකාර, සැළසුම්ශිල්පී, ප්‍රධාන කාර්මික ශිල්පී, පොත් තබන්නා
කළමනාකරණ සහකාර (තාක්ෂණික), කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන), කළමනාකරණ සහකාර (මුදල් අයකැමි/ ප්‍රදර්ශක/ පරීක්ෂණ සේවා)
ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය (ශිල්පීය/ අර්ධ ශිල්පීය/ ශිල්පීය නොවන)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාර්ථී
පර්යේෂණ විද්‍යාර්ථී
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු/ විද්‍යාඥ
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු/ විද්‍යාඥ
පර්යේෂණ ඉංජිනේරු/ විද්‍යාඥ ඉංජිනේරු



5

සභාපතිතුමාගේ පණිවුඩය

මෙරට ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන සංවිධානයක් වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (නර්ඩ) 2019 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ඉංජිනේරු මැදිහත්වීමක් ලබාදීමේ අරමුණින්, නර්ඩි මධ්‍යස්ථානය පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, නියමු ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති, උපදේශන සේවා, කර්මාන්ත සඳහා තාක්ෂණික සේවා, තාක්ෂණය ප්‍රචලිත කිරීම, සිසුන් හා ප්‍රජාව අතර විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම යනාදි අංශවල නියැලී සිටී.

බලශක්ති හා පාරිසරික, නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම්, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන්හි නියැලෙමින් රජයේ සංවර්ධන වැඩසටහන් හා සමගාමීව රටේ ආර්ථික දියුණුවට නර්ඩි මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්වල ප්‍රතිදාන සහා ප්‍රතිලාභ හේතුවී තිබේ.

නර්ඩි මධ්‍යස්ථානය 2019 වර්ෂය තුලදී ප්‍රධාන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති ලෙස කෘෂිකාර්මික හා වැවිලි ක්ෂේත්‍රය සඳහා ඇළ මාර්ගවල වල් පැලෑටි ඉවත් කිරීම සඳහා ජලජ වල්පැලෑටි ඉවත්කිරීමේ යන්ත්‍ර සංවර්ධනය කිරීම, කිලෝග්‍රෑම් 50 ක ධාරිතාවයකින් යුත් එළවළු වියළන යන්ත්‍ර සංවර්ධනය කිරීම සහ පොල් කර්මාන්තය සඳහා යන්ත්‍රෝපකරණ සංවර්ධනය කිරීම සිදු කර ඇත.

නර්ඩි මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණය මත පදනම්ව රට පුරා ආදාහනාගාර 200 කට වැඩි ප්‍රමාණයක් ස්ථාපිතව ඇත. මධ්‍යස්ථානය විසින් හඳුවාදෙනු ලැබූ මෙම ආදාහනාගාර තාක්ෂණය, පාරිසරික බලපෑම් අවම වන සේ තවදුරටත් වැඩිදියුණු කර ද්විත්ව කුටීර ආදාරහනාගාර නිපදවීම මෙම වසර තුළ සිදු කරන ලද ප්‍රධානතම ව්‍යාපෘතියකි.

කර්මාන්ත සඳහා අධි තාක්ෂණික යන්ත්‍රෝපකරණ භාවිතයෙන් නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීමට මෙන්ම ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් සපුරාලීම සඳහා අවශ්‍ය පරීක්ෂණ පහසුකම් ඇති කිරීම සඳහා 2019 දී සම්මත මූලාකෘති හා පරීක්ෂණ පහසුකම් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

කාර්මික ක්ෂේත්‍රයට අදාළව ආප්ප නිෂ්පාදනය කිරීමේ ස්වයංක්‍රීය යන්ත්‍රය සංවර්ධනය කිරීම, ස්වයංක්‍රීයව යෝගට් පිරවුම් යන්ත්‍රය සංවර්ධනය කිරීම, කොහු ලණු සැකසීමේ යන්ත්‍රය සංවර්ධනය කිරීම වැනි පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් 2019 වසර තුලදී අවසන් කර ඇත. තවද, කොළඹ ජාතික රෝහල සඳහා රසායනාගාර වාර්තා සහ සාම්පල ස්වයංක්‍රීයව හුවමාරු කිරීමේ පද්ධතියක් නිර්මාණය කිරීම සහ රථවාහන ගාල් කිරීමේ ස්වයංක්‍රීය අධීක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියද සිදු කර ඇත.

තාක්ෂණ, පර්යේෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස පහසුකම් සහිත වියදම් පිරිමැසුම්දායක දෙමහල් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 දී ආරම්භ කර ඇත. තවද, නර්ඩ් තාක්ෂණයන් මත පදනම් වූ වාණිජ ව්‍යාපෘති රාශියක් 2019 වසර තුලදී සිදු කර ඇත.

කුඩා පරිමාණ ව්‍යවසායකයාගේ සිට මහා පරිමාණ කර්මාන්ත කරුවන් සඳහා තාක්ෂණික, බලශක්ති හා පාරිසරික ගැටළු පදනම් කර ගනිමින් විවිධ තාක්ෂණික සේවාවන් සැපයීම නර්ඩ් මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන ප්‍රමුඛතම කාර්යයකි.

රටේ කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය සියළුම ඉංජිනේරු උපදේශන සේවාවන් සැපයීම අඛන්ඩව සිදු කරනු ලබන අතර විවිධ කර්මාන්ත සඳහාවූ විශේෂ පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 2019 වර්ෂය පුරා පවත්වා ඇත.

නර්ඩ් මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් ප්‍රචලිත කිරීම සහ රට පුරා ව්‍යවසායකයින් වෙත එම තාක්ෂණයන් පැවරීම සිදු කරනු ලැබේ. වාර්ෂිකව පවත්වනු ලබන විවෘත දින වැඩසටහන, දින දෙකක් තුල මධ්‍යස්ථානයේ තාක්ෂණ උද්‍යානයේ සංවිධානය කරනු ලැබූ අතර එහිදී විවිධ තාක්ෂණික නිරූපනයන් මගින් ජනතාව දැනුවත් කරන ලදි. 2019 වර්ෂය සඳහා පර්යේෂණ සමුළුව නර්ඩ් ශ්‍රවණාගාරයේදී මධ්‍යස්ථානයේ සියලුම ඉංජිනේරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ඉහත සියළු කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී නර්ඩ් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජි. ඩී.ඩී. ආනන්ද නාමල් මහතාගේ මෙහෙයවීම හා දායකත්වය ප්‍රශංසනීය වන අතර නර්ඩ් මධ්‍යස්ථානයේ කාර්ය සාධනය සහ ආයතනික ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා ඔහු විසින් දරනු ලබන උත්සාහය හා කැපවීම බෙහෙවින් අගය කළ යුතුය. 2019 වසරේදී ආයතනික ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ, ඉංජිනේරු සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය මෙන්ම අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය විසින් ලබාදුන්නාවූ දායකත්වය වෙනුවෙන් ස්තූති කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

ප්‍රශාන්න විතාන
වැ.බ. සභාපති

6



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng. (Energy Technology), BSc Eng. (Hon), C Eng., MIE (SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජී.කේ.කේ.ඒ ද සිල්වා මයා (2019.06.02 දක්වා)
M Sc (Building Technology), B Sc Eng (Hons), C Eng., MIE (SL)

ඉංජි. ජෙ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා (2019.06.20 සිට)
M Eng., BSc Eng., MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඒ. එච්. පියසිරි මයා (2019.11.09 දක්වා)
M Sc (Management of Technology), B Sc Eng. (Hons)

ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු වශයෙන්

සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)

ඉංජි. ජේ.ඒ.සී. ක්‍රිෂාන්ති මිය
M Eng., BSc Eng.,C Eng., MIE (SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. ඩබ්.ඩබ්.පී.කේ. පෙරේරා මයා
M Eng., BSc Eng. (Hons), C Eng., MIE (SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. අයි.පී. බටුවිට මයා
M Eng, B Sc Eng., AMIE (SL)

ඉංජි. ඒ.එන්.එස්. අමරදාස මයා
BSc Eng., AMIE (SL)

එච්.සී. එගොඩගමගේ මිය (2019.03.11 සිට)
BSc Eng., AMIE(SL)

ඉංජිනේරු

කේ.එස්.එස්. වීරසිංහ මිය
Special Apprentice (Civil Eng.), IESL (Part I)

කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)

ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා
MSc Eng., BSc Eng., AMIE (SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

වයි.එම්.එම්.කේ. රණතුංග මිය
NDT

ඉංජි. ඒ.ජේ.ජී.එස්. දහනායක මයා
BSc Eng., C Eng., MIE(SL)

ආචාර්ය ඒ.ඒ.පී.ඩී. ලියනගේ මයා (2019.09.09. සිට)
PhD, MSc, BSc

ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ

ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මයා (2019 .12.16 සිට)
PhD, MSc, BSc

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. පී.එම්.වයි.එස්. පතිරාජ මිය
BSc Eng., MSc., AMIE (SL)

ඉංජි. එස්.ඒ.පී. ශලින්ද සිල්වා මයා
BSc Eng., M Eng., C Eng, MIE (SL)

ආචාර්ය ටී.එන්. ප්‍රනාන්දු මෙනවිය (2019.09.02 සිට)
PhD, B.Tech, AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. කේ. සිවසුදන් මයා
BSc Eng., AMIE (SL)

බලශක්ති හා පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී/ දෙපාර්තමේන්තු ප්‍රධානී

ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා (2019.06.19 දක්වා)
M Eng., BSc Eng., C Eng., MIE (SL)

පර්යේෂණ විද්‍යාර්ථී

ඉංජි. ඩබ්.කේ.ආර්. පීරිස් මයා
MA (Buddhist Stud), BSc Eng., C.Eng. MIE(SL)

ඉංජි. ඊ.ඒ.එන්.කේ. එදිරිසිංහ මයා
MPhil, BSc Eng., MIE (SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එච්.එම්.එල්.යූ. හේරත් මයා
BSc Eng., AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. පී.එෆ්.එස්. පෙරේරා මයා
BSc Eng., MEng., AMIE (SL)

ඉංජි. එස්.එම්.වී.පී.ඩී. සේනානායක මයා (2019.04.10 සිට)
BSc Eng., AMIE(SL)

ඉංජිනේරු

ඩබ්.ඒ.එල්.එස්. කරුණාවර්ධන මයා
HNDE

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

පර්යේෂණ විද්‍යාර්ථී/ දෙපාර්තමේන්තු ප්‍රධානී

ඉංජි. එන්.ජී.ඩී. විජේසිරිවර්ධන මිය
M Eng., C Eng., MIE (SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. යූ.සී. බොතේජු මයා (2019.09.02 සිට)
BSc Eng. C Eng., MIE (SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ඩී.ඒ.එම්.එස්.කේ. හේමසිරි මයා (2019.09.02 සිට)
MSc. BSc Eng.

පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමලරත්න මිය
BTech Hons, AMIE (SL)

ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා
BTech. AMIE (SL)

ඉංජි. එච්.කේ.අයි.එස්. ලක්මාල් මයා
BSc Eng. AMIE (SL)

මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. ඩී.එම්. පුංචිබණ්ඩා මයා
BSc Eng., AMIE(SL)

පර්යේෂණ විද්‍යාර්ථී /දෙපාර්තමේන්තු ප්‍රධානී
ඉංජි. කේ.ටී. ජයසිංහ මයා
M Eng., BSc Eng., C Eng., MIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු (2019.09.02 සිට)
ඉංජි. එච්.පී.එච්. කුමාර මයා
MSc Eng., EC(UK) PART I & II, AMIE(SL)

ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ
ආචාර්ය ටී.ඒ සුරංග අනුරුද්ධ මයා (2019.10.01 සිට)
PhD, MSc. BSc(IT)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
එන්.එස්.කේ. සමරසිංහ මයා (2019.03.22 සිට)
M Sc, BSc Eng., AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එස්.එම්.එස්. සේනාරත්න මයා
MSc Eng., B Tech, AMIS(SL)

ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා
B Tech., AMIE(SL)

ඉංජි. එම්.ඒ.ටී.එම්. කුමාර මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. ජේ.ඩී.එම්.එච්. ජයන්තා මිය
BSc Eng, AMIE(SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එන්.පී.ටී. පෙරේරා මෙනවිය
MSc, BSc Eng. (Hons.), AMIE(SL)

ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මෙනවිය
MSc, MEng, BSc Eng., AMIE(SL)

ආචාර්ය එස්.එම්. පතිරණ මිය (2019.09.09 සිට)
PhD, MSc, BSc, AMIESL

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එම්.ඩී. සහර්දීන් මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා
BSc Eng.(Hons), AMIE(SL)

ඉංජි. ජී.එස්.ආර්. කොස්තා මිය
M Eng., BSc Eng, AMIE(SL)

ඉංජිනේරු
එච්.ඩී.සී. හෙට්ටිආරච්චි මිය
NDT

සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. කේ.එල්. මීදෙණිය මයා
MSc Eng., BSc Eng., MIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඩබ්.පී.ආර්.ඩී. වීරසිංහ මයා
NDT, CEI PART I, IESL Part I

ඉංජි. එස්.ඩී.එස්.පී. සෝලංගආරච්චි මයා (2019.09.11 සිට)
MSc, BSc

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඩී.එම්. එක්නැලිගොඩ මයා (2019.03.01 සිට)
BSc, AMIESL

ඉංජි. එම්.ඒ.ඩී.එස්. ප්‍රේමදාස මයා (2019.05.03 සිට)
MBA, BSc, AMIESL

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ (ගෘහ නිර්මාණ)
බී.ඩී.ආර්. වාමිකා මිය
MSc, BSc. Chartered Architect AIA (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ටී.කේ. ගීගනගේ මයා
BSc Eng. AMIE(SL)

ඉංජිනේරු
ඩී.එම්.ඒ.කේ. දිගල මිය
Special Apprentice (Civil Eng.), IESL(Part 1)

පී.ඒ.යූ.ඩබ්.කේ. පරණගම්පොල මයා
NDES

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මයා
BSc Eng.(Hons), MBA, C Eng, MIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ජේ.කේ.අයි.පී. ජයසිරි මිය (2019.06.10 සිට)
BSc

පර්යේෂණ විද්‍යාඥ
බී.ඩී.පී.එස්. රණවීර මිය
BSc.

සහකාර අධ්‍යක්ෂ - අලෙවි
පී.එන්.ඩී. පතිරණ මිය
BSc (Hons) Sp. MCIM (UK), MSLIM (SL)

තාක්ෂණික ඉන්කියුබේටර් අංශය

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු/අංශ භාර නිලධාරී

ඉංජි. ඒ.ආර්.සී. සල්ගාදු මයා
BSc Eng, AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. සුරේශ් පී පෙරේරා මයා
C Eng. MMechE (UK), NDT, AMIE (SL)

නඩත්තු ඒකකය හා මධ්‍යම වැඩහල	තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය
ඉංජිනේරු එන්.ඒ.ඩී.ඩී.ජේ. ප්‍රසන්න මයා NDT	**පාලක - තාක්ෂණ උද්‍යානය** ඩබ්.කේ.සී.පී. වල්පොල මයා (2019.07.01 සිට) BSc **පාලක - ඉංජිනේරු කෞතුකාගාරය** ඩී.කේ. ජයවීර මිය BSc (Hons.)
මානව සම්පත් දෙපාර්තමේන්තුව	**මූල්‍ය දෙපාර්තමේන්තුව**
අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී.ඒ.එම්. මුණසිංහ මිය MBA (HRM), BSc (HRM), AM(CIPM)	**අධ්‍යක්ෂ (මූල්‍ය)** ඩී.වී.එස්. පෙරේරා මිය ICMA Professional Part II, IPFA, ICEA
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ආර්. ගමගේ මයා MA in Sociology, MLRHRM, BA (Social Sc.) Sp.	**ගණකාධිකාරී** ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මයා MBA, BBA Sp. , CPFA, ICASL – Prof. Part I
තොරතුරු තාක්ෂණ අංශය	
ජාල පරිපාලක බී.පී. වික්‍රමසූරිය මයා MSc , BSc (Computing & Infor. Systems)	**පුස්තකාලයාධිපති** ඩී.එම්.ටී.පී.කේ. දේවගිරි මිය MSc, BA (Library Science) Sp., ASLLA
අභ්‍යන්තර විගණන අංශය	**ප්‍රසම්පාදන අංශය**
අභ්‍යන්තර විගණක බී.පී.එස්. කුමාර මයා MPM, HNDA	**සැපයුම් නිලධාරී** ආර්.එච්.ඒ. ජීවානන්ද මයා BSc (Physical Science)



7

මානව සම්පත් කළමනාකරණය

ආයතනයක අරමුණු ඉටු කර ගැනීමේදී මානව සම්පත වටිනාම සාධකය වේ. පර්යේෂණ ආයතනයක වශයෙන් ගත් කළ මානව සම්පතෙහි වැදගත් කම වඩාත් ප්‍රමුඛ වේ. මධ්‍යස්ථානයේ සියළුම කාර්යයන්හි සාර්ථකත්වය, එනම් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති, පුහුණු වැඩසටහන් සහ කාර්මික සේවා සැපයීම යනාදියෙහි කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය මුළුමනින්ම රදා පවතිනුයේ සෑම සේවා කාණ්ඩයකම කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප මත ය. ඒ අනුව, ආයතනය තුල මානව සම්පත් කළමනාකරණය ඵලදායී ලෙස ඉටු කිරීමට සෑම ප්‍රයත්නයක්ම ගනු ලැබේ.

2019 වර්ෂයේ මධ්‍යස්ථානයේ සමස්ථ කාර්යමණ්ඩල තොරතුරු සාරාංශය

සේවා කාන්ඩය	අනුමත කාර්යමණ්ඩලය	තත්‍ය කාර්යමණ්ඩලය (2019.12.31 දිනට)
ඉහළ කළමනාකරණය	3	2
ඉංජිනේරු/ විද්‍යාඥ කාර්ය මණ්ඩලය	68	59
අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	10	9
කණිෂ්ඨ කළමණාකාර කාර්ය මණ්ඩලය	14	10
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	25	23
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	52	52
ප්‍රථමික - ශිල්පීය කාර්ය මණ්ඩලය	104	100
ප්‍රථමික - අර්ධ ශිල්පීය කාර්ය මණ්ඩලය	3	0
ප්‍රථමික - ශිල්පීය නොවන කාර්ය මණ්ඩලය	65	41
සමස්ථ කාර්ය මණ්ඩලය	**344**	**296**



7.1 කාර්යමණ්ඩල කළමනාකරණය

7.1.1 2019 වර්ෂය තුල නව බඳවාගැනීම් (බාහිර)

	නම	තනතුර		නම	තනතුර
1	ජී.ඩී. සඳකැළුම් මයා	යන්ත්‍ර ශිල්පී	21	කේ.එල්. සනදීප පෙරේරා මයා	කම්කරු
2	එච්.එල්.ආර්.එල්. සම්පත් මයා	යන්ත්‍ර ශිල්පී	22	එන්.ආර්.වී. ජයවික්‍රම මයා	කම්කරු
3	කේ.ඒ.එස්.එස්. වීරසිංහ මයා	විදුලි කාර්මික	23	අයි.ටී. මදුරංගන සිල්වා මයා	කම්කරු
4	ඩී.එම්. එක්නැලිගොඩ මයා	**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**	24	අයි.එල්.වී. රවිසර මයා	කාර්යාල සහායක
5	ටී.පී.ආර්. සොමරත්න මිය	පාලක (නඩත්තු)	25	ඒ. චමිදු පැතුම් මයා	කම්කරු
6	ඩබ්.ඩබ්. කලුආරච්චි මයා	කාර්මික සහකාර (විදුලි)	26	එන්.පී.එන්. ප්‍රබුද්ධ මයා	කම්කරු
7	ඩබ්.කේ.ඩී. සම්පත් මයා	කාර්මික සහකාර (සිවිල්)	27	එච්.ඩී.බී. රොෂාන් මයා	කම්කරු
8	එච්.සී. එගොඩගමගේ මිය	පර්යේෂණ ඉංජිනේරු	28	ජේ.පී.එස්. තරිඳු මයා	කාර්යාල සහායක
9	ඩබ්.ටී. චතුරංග මයා	කාර්මික සහකාර (සිවිල්)	29	එච්.එම්. අයි මදුෂංක මයා	කම්කරු
10	එන්.එස්.කේ. සමරසිංහ මයා	**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**	30	යූ.ඩී.ඩී.එස්. සම්පත් මයා	කම්කරු
11	කේ.එල්. මීදෙණිය මයා	අධ්‍යක්ෂ (තාක්ෂණික)	31	එම්.එස්. දේවපුර මයා	**ජ්‍යෙෂ්ඨ** පර්යේෂණ ඉංජිනේරු
12	එස්.එම්.වී.පී.ඩී. සේනානායක මයා	පර්යේෂණ ඉංජිනේරු	32	ඩී.එම්.පී.ගුණවර්ධන මයා	අලෙවි නිලධාරී
13	ජේ.එම්.යූ. ගයාන් මයා	පර්යේෂණ ඉංජිනේරු	33	ආචාර්ය ටී.එන්. ප්‍රනාන්දු මෙනවිය	**ජ්‍යෙෂ්ඨ** පර්යේෂණ ඉංජිනේරු
14	එම්.ඒ.ඩී.එස්. ප්‍රේමදාස මයා	**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**	34	ආචාර්ය ඒ.පී.ඩී. ලියනගේ මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු .
15	පී.පී.එච්.යූ. කුමාරසිරි	රියදුරු	35	ආචාර්ය එස්.එම්. පනිරණ මිය	**ජ්‍යෙෂ්ඨ** පර්යේෂණ ඉංජිනේරු
16	ජේ.කේ.අයි.පී. ජයසිරි මිය	පර්යේෂණ ඉංජිනේරු	36	එස්.ඩී.එස්.පී.සෝලංගආරච්චි මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
17	ඩබ්.කේ.සී.පී. වල්පොල මිය	පාලක (තාක්ෂණ උද්‍යානය)	37	එච්.ඩබ්.ජී.රවිඳු මයා	කාර්යාල සහායක
18	ඒ.ටී.ඩී. රොද්‍රිගෝ මෙනවිය	පොත් තබන්නා	38	ආචාර්ය. සුරංග අනුරුද්ධ මයා	ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ
19	එල්.කේ. තරිඳු ඉඳුනිල් මයා	කම්කරු	39	ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මයා	ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ
20	ඩබ්. අයි. කාවින්ද මයා	කම්කරු			

7.1.2 2019 වර්ෂය තුල සේවයෙන් විශ්‍රාම ගැනීම් හා සේවයෙන් ඉල්ලා අස්වීම්

විශ්‍රාම ගැනීම්			ඉල්ලා අස්වීම්		
	නම	තනතුර		නම	තනතුර
1	එල්. සිරිනීල් ප්‍රනාන්දු මයා	වැද්දුම්/ පෑස්සුම්කරු	1	එම්.එම්.එම්. මනාස් මයා	පර්යේෂණ ඉංජිනේරු
2	කේ.ආර්. ප්‍රේමසිරි මයා	රියදුරු	2	සංජය නිරෝෂන මයා	ආයුධ භාරකරු
3	ඉංජි. ජී.කේ.කේ.ඒ. ද සිල්වා මයා	නි. අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	3	එච්.යූ.එස්. බණ්ඩාර මයා	රියදුරු
			4	ඊ.ඒ.පී. චතුරංග මයා	යන්ත්‍ර ශිල්පී
4	එච්.ඒ.එන්. පද්මිණි මිය	පරිපාලන නිලධාරී	5	ඩබ්.එම්.එන්.එල්.යූ.වන්දෙස්න මිය	කාර්මික සහකාර
5	ඩබ්.එස්.පී. පෙරේරා මයා	කම්කරු	6	ජේ.එම්.යූ. ගයාන් මයා	පර්යේෂණ ඉංජිනේරු
6	ඒ.එච්. පියසිරි මයා	නි. අධ්‍යක්ෂ ජනරාල් (සේවා)	7	පී.එම්.ඩී. සඳරුවන් මයා	අලෙවි නිලධාරී
7	ඒ.ඩී.ඒ.ආර්. ප්‍රේමවංශ මයා	කාර්මික නිලධාරී	8	යූ.එස්. වර්ණකුල මයා	පාලක-වැඩහල
			9	බී. ධම්මිත් ප්‍රියංක මයා	කාර්යාල සහායක

7.2 වෘත්තීය සංවර්ධනය

7.2.1 අභ්‍යන්තර තනතුරු උසස්වීම්

	නම	පැවති තනතුර	උසස්වීම් ලද තනතුර
1	ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා	පරියේෂණ විද්‍යාර්ථී	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සවර්ධන)
2	ඉංජි. එච්.පී.හේමන්ත කුමාර මයා	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
3	ඉංජි. සී.යූ. බොතේජු මයා	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
4	ඩබ්.ඒ.ආර්.එම්. පෙරේරා මයා	වැද්දුම්/ පෑස්සුම්කරු	පෑස්සුම්කරු

7.2.2 අභ්‍යන්තර ශ්‍රේණි උසස්වීම්

	සේවා කාන්ඩය	ශ්‍රේණි උසස්වීම	උසස්වීම් ලද සංඛ්‍යාව
1	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	III ශ්‍රේණිය සිට II ශ්‍රේණිය	01
2	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	II ශ්‍රේණිය සිට I ශ්‍රේණිය	07
3	ප්‍රාථමික මට්ටම (පුහුණු)	III ශ්‍රේණිය සිට II ශ්‍රේණිය	06
4	ප්‍රාථමික මට්ටම (නුපුහුණු)	III ශ්‍රේණිය සිට II ශ්‍රේණිය	01

7.2.3 කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම්

	සේවා කාන්ඩය	කාර්යක්ෂමතා කඩඉම	අයදුම් කළ සංඛ්‍යාව	සමත් වූ සංඛ්‍යාව
1	අධ්‍යයන හා පර්යේෂණ (AR 1-2)	පළමු කාර්යක්ෂමතා කඩඉම	05	05
3	කණිෂ්ඨ කළමනාකාර (JM 1-2)	පළමු කාර්යක්ෂමතා කඩඉම	04	03
4	කළමනාකරණ සහකාර - තාක්ෂණික (MA 2-2)	පළමු කාර්යක්ෂමතා කඩඉම	06	03
5	කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2)	දෙවන කාර්යක්ෂමතා කඩඉම	04	04

7.3 පුහුණුව සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

නර්ඩ් මධ්‍යස්ථානයෙහි මූලික කාර්යය ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතීන්හි නියැලීමයි. එහිදී මධ්‍යස්ථානයේ මානව සම්පත් ධාරිතාවය වර්ධනය කිරීම කෙරෙහි නිරන්තර අවධානය යොමු කෙරේ. ඒ අනුව, කළමනාකාරිත්වය විසින් සියළුම අංශයන්හි කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ නිපුණතා වැඩි දියුණු කිරීම මෙන්ම ආකල්ප සංවර්ධනය සඳහා සියලු පියවර ගනු ලබන්නේ මධ්‍යස්ථානයට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා ගැනීම මෙන්ම කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගෙන වේ.

7.3.1 2019 වර්ෂයේදී නර්ඩ් මධ්‍යස්ථානය කාර්ය මණ්ඩලය සඳහා දී ඇති පුහුණු හා සංවර්ධන අවස්ථාවන්

සේවා ඛාන්ඩය	පුහුණු අවස්ථාවන් ගණන
ඉංජිනේරු / විද්‍යාඥ	39
අනෙකුත් විධායක	13
කණිෂ්ඨ කළමනාකරණ	2
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	8
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	11
ප්‍රාථමික	4
එකතුව	77



7.3.2 පශ්චාත් උපාධි /වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා පහසුකම් සැළසීම

2019 වසර තුල පශ්චාත් උපාධි පාඨමාලාවන් ආරම්භ කිරීම				
	නම	තනතුර	සුදුසුකම	ආයතනය
1	අයි.ඩී.එම්.එව්. ජයන්තා මිය	පර්යේෂණ ඉංජිනේරු	M Sc/PG Diploma Course in Electrical Installation	මොරටුව විශ්වවිද්‍යාලය
2019 වසර තුල කරගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවන්				
	නම	තනතුර	සුදුසුකම	ආයතනය
1	බී.ඩී.පී.එස්. රණවීර මිය	පර්යේෂණ විද්‍යාඥ	M Sc Degree Programme in Industrial and Environmental Chemistry 2016/18	කැලණිය විශ්වවිද්‍යාලය
2	ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා	පර්යේෂණ ඉංජිනේරු	M Eng./PG Diploma in Environmental Eng. & Mgt.	මොරටුව විශ්වවිද්‍යාලය
3	ඉංජි. ටී.කේ. ගීගනගේ	පර්යේෂණ ඉංජිනේරු	M Sc./PG Diploma Course in Sustainable Process Eng.	මොරටුව විශ්වවිද්‍යාලය
4	ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මිය	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	PhD Studies of Engineering and Computer Sciences	Australian National University
5	ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	M Sc Eng (Communication and Information Eng.)	පේරාදෙණිය විශ්වවිදයාලය
6	ඉංජි. යූ.සී. බොතේජු	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	M Sc Eng (Control & Instrumentation)	පේරාදෙණිය විශ්වවිදයාලය
2019 වසර තුල පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම				
	නම	තනතුර	සුදුසුකම	ආයතනය
1	අයි.පී. බටුවිට මයා	පර්යේෂණ ඉංජිනේරු	PG Diploma/M Eng in Highway &Traffic Eng.	මොරටුව විශ්වවිද්‍යාලය
2	ජී.එස්.ආර්. කොස්තා මිය	පර්යේෂණ ඉංජිනේරු	M Eng./PG Diploma Pro.in Energy Technology	මොරටුව විශ්වවිද්‍යාලය
3	බී.පී. වික්‍රමසූරිය මයා	ජාල පරිපාලක	M Eng./PG Diploma in Information Tech. -2016	කොළඹ විශ්වවිද්‍යාලය

7.3.3 විදේශ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන්/ වැඩමුළු සඳහා සහභාගී වීම

	නම සහ තනතුර	වැඩසටහන	රට	කාලපරිච්ඡේදය
1	පී.එන්.ඩී. පතිරණ මිය සහකාර අධ්‍යක්ෂ (අලෙවි)	International Training Workshop on ‘ Technopreneurship for Developing Countries” in Kuala Lumpur, Malaysia	මැලේෂියාව	11.03.2019 - 15.03.2019
2	ඉංජි. ඩී.එම්. පුංචිබණ්ඩා මයා අධ්‍යක්ෂ (තාක්ෂික)	Senior Management Programme On Managing Research Technology Organizations (Rtos)	මැලේෂියාව	28.04.2019- 05.05.2019
3	ඉංජි. එම්.ඒ.ඩී.එම්. කුමාර මයා පරියේෂණ ඉංජින්රු	WAITRO-SIRIM Capacity Building Workshop on IOT technology application for smart farming	මැලේෂියාව	28.04.2019- 05.05.2019
4	ඉංජි. ටී.කේ. ගීගනගේ මයා පර්යේෂණ ඉංජිනේරු	Solar Thermal Technology for Industrial Application	මැලේෂියාව	28.04.2019- 05.05.2019

	නම සහ තනතුර	වැඩසටහන	රට	කාලපරිච්ඡේදය
5	ඉංජී. එස්.ඒ.පී. ශලින්ද මයා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	Capacity Building Programme- w/s for Commercialization of Research and Innovation	මැලේෂියාව	28.04.2019-05.05.2019
4	ඩබ්.ඒ.ඩී.එල්.එස්. කරුණාවර්ධන මයා ඉංජිනේරු	Training on Advanced Bio Gas Technology for the Belt and Road Developing Country	චීනය	02.06.2019-21.06.2019
5	ඉංජී. ජේ.ඒ.ඒ.ඩී ජයසූරිය මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	Regional Workshop on New Paradigm in Technology Transfer and Commercialization	ඉන්දියාව	08.07.2019-10.07.2019
6	ඉංජී. ජේ.ඒ.ඒ.ඩී ජයසූරිය මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	4th Meeting of the Indo-Sri Lanka Joint Committee on Science and Technology	ඉන්දියාව	13.08.2019-14.08.2019
7	ඉංජී. එස්.ඒ.පී. ශලින්ද මයා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	Training Course on Technology of Agricultural Machinery and Water Saving Irrigation for Sri Lanka	චීනය	22.08.2019-20.09.2019
8	ඉංජී. එච්.ඒ.කේ. හපුආරච්චි මයා පර්යේෂණ ඉංජිනේරු	Training Course on Technology of Agricultural Machinery and Water saving Irrigation for Sri Lanka	චීනය	22.08.2019-20.09.2019
9	ජේ.එම්.එච්.යූ. බණ්ඩාර මයා කාර්මික සහකාර	Training Course on Technology of Agricultural Machinery and Water saving Irrigation for Sri Lanka	චීනය	22.08.2019-20.09.2019
10	ඉංජී. පී.එම්.වයි.එස්. පතිරාජ මිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	2019 KISTEP-ISTIC S&T INNOVATION TRAINING PROGRAM FOR HIGH LEVEL POLICY MAKERS - “S&T P.I.E Framework Focusing on Foresight and Evaluating”	කොරියාව	29.10.2019-01.11.2019
11	ඉංජී. ජේ.ඒ.ඒ.ඩී ජයසූරිය මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	The 15th Session of the Governing Council of the Asian and Pacific Centre for Transfer of Technology (APCTT)”, International Conference on Emerging Technologies for Achieving Sustainable Development Goals”	මැලේෂියාව	05.11.2019-07.11.2019
12	ඩබ්.පී.ආර්.ඩී. වීරසිංහ මයා ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	The National Convention of Ferro-cement Society, India	ඉන්දියාව	06.11.2019-11.11.2019

7.3.4 කාර්යස්ථානයෙන් බැහැරව සිදුකරනු ලැබූ නේවාසික පුහුණු හා සංවර්ධන වැඩමුළු

ආයතනයට අලුතින් බඳවාගන්නා ලද කාර්ය මණ්ඩලයේ 25 දෙනෙකු සඳහා 2019 අප්‍රේල් 09 සහ 10 යන දිනයන්හිදී නේවාසික පුහුණු වැඩසටහනක් මධ්‍යස්ථානයෙ තාක්ෂණ උද්‍යානයේදී පවත්වන ලදි.

7.4 ආධුනිකයින් සඳහා වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් සළසාදීම

විශ්වවිද්‍යාල හා පිළිගත් වෘත්තීය/කාර්මික පුහුණු ආයතනයන් විසින් යොමු කරනු ලැබූ ආධුනිකයින් 61 දෙනෙකු සඳහා මාස 3/ මාස 6 සහ වසරක වැනි කාල පරිච්ඡේදයන්ට අදාළව වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් 2019 වර්ෂය තුල දී සළසාදී ඇත.



2019 වසරේ කාර්යසාධනය පිළිබිඹු කිරීම







ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වල නියුතු තාක්ෂණික දෙපාර්තමේන්තු 05 ක්, තාක්ෂණික සේවා සපයන දෙපාර්තමේන්තු 03 ක් සහ ඊට අමතරව මුල්‍ය සහ මානව සම්පත් කළමනාකරණය සඳහා වූ දෙපාර්තමේන්තු 02 කින් ද සමන්විත වේ.

තාක්ෂණික දෙපාර්තමේන්තු මගින් සිවිල් ඉංජිනේරු, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු , මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු, බලශක්ති හා පාරිසරික ඉංජිනේරු සහ කෘෂිකර්ම හා යන්ත්‍රෝපකරණ සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාළව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කෙරේ.

කර්මාන්ත වෙත අවශ්‍ය තාක්ෂණික සේවාවන් වාණිජ්‍යමය වශයෙන් සැපයීම සිදු කරනු ලබන්නේ බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව විසිනි.

ව්‍යාපෘති හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මධ්‍යස්ථානයේ වැඩි දියුණු කරණු ලැබූ තාක්ෂණයන් මත පදනම් වූ වාණිජ ව්‍යාපෘතීන් සිදු කරනු ලබයි. උදාහරණ ලෙස වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදිකිරීම්, ආදාහනාගාර ඉදිකිරීම්, ජීවවායු ජනක ඉථාපිත කිරීම යනාදිය සඳහන් කළ හැක.

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව විසින් මධ්‍යස්ථානයේ වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් ප්‍රචලිත කිරීම හා සමාජගත කිරීම සිදු කෙරේ.

2019 වසරේ නිම කරන ලද ප්‍රධාන පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික සේවාවන්, වාණිජ ව්‍යාපෘතීන් හා තාක්ෂණික ප්‍රවලිත කිරීම් සාරාංශගතව පහත සඳහන් පරිදි වේ.

8.1 ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘතීන්

- **මධ්‍යස්ථානය විසින් හඳුන්වාදෙනු ලැබූ අදාහණාගාර තාක්ෂණය, පාරිසරික බලපෑම් අවම වන සේ තව දුරටත් වැඩි දියුණු කර ද්විත්ව කුටීර ආදහනාගාර ලෙස සංවර්ධනය කිරීම.**



1990 වසරේදී මධ්‍යස්ථානය විසින් හඳුන්වාදෙනු ලැබූ තාක්ෂණය අනුව ආදාහනාගාර 200ක් පමණ මේ වන විට දිවයින පුරා ස්ථාපිතව ඇත. මේ වන විට පාරිසරික නියාමනයන් ක්‍රම ක්‍රමයෙන් තීව්‍ර වෙමින් අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූල වනසේ ආදාහනාගාර ස්ථාපිත කළ යුතුව ඇත. විශේෂයෙන් නාගරික ප්‍රදේශ වලදී ආදාහනාගාර අවට ප්‍රදේශවාසීන්ට සෞඛ්‍යාශ්‍රිත ගැටලු පැන නොනගින ලෙස නිර්මාණය කළ යුතුව ඇත.

ඒ අනුව, වැඩි දියුණු කරන ලද පලමු ආදාහනාගාරය කුරුණෑගල, මල්කඩුවාවේ, කුරුණෑගල මහනගර සභාව වෙනුවෙන් ඉදිකර ඇත. 2019 වසර අවසන් වනවිට, පර්යේෂණ මට්ටමෙන් ආදාහනාගාර කිහිපයක් සාර්ථක ලෙස නිම කර ඇත.

- **ඇල මාර්ගවල ජලජ ශාක ඉවත් කිරීම සඳහා නිපදවන ලද ජලජ පැලෑටි ඉවත්කිරීමේ යන්ත්‍රය.**

මෙම ව්‍යාපෘතිය, ඇල මාර්ග අවහිර කරමින් වැවෙන ජලජ ශාක ඉවත් කිරීම සඳහා නිපදවනු ලැබූ අතර 2019 වසරේදී සාර්ථක ලෙස ක්ෂේත්‍ර පරීක්ෂණ නිම කරන ලදි. ඒ අනුව වඩාත් පහසුවෙන් ක්‍රියාකරවීමට හැකිවන සේ යන්ත්‍රය වැඩි දියුණු කර ඇත.





- **රෝහල්වල රසායනාගාර වාර්තා / සාම්පල ස්වයංක්‍රීයව හුවමාරු කිරීමේ පද්ධතිය**

කොළඹ ජාතික රෝහලේ සේවකයින් 200 ක් පමණ යොදවා ගනිමින් මෙම කාර්යය සිදු කරනු ලැබේ. එය විධිමත්ව හා කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා ප්‍රධාන විද්‍යුත් පුවරුවක් හා ආශ්‍රිත නල පද්ධතියකින් යුක්තව මෙම නිර්මාණය කර ඇත. නල තුලින් සාම්පල / වාර්තා යවනු ලබන්නේ වායු පීඩනය යොදාගෙන වන අතර මේ වන විට මෙම පද්ධතිය මධ්‍යස්ථානයේ වැඩහල තුලදී සාර්ථකව අත් හදා බලා ඇත. කොළඹ ජාතික රෝහලේ අවශ්‍යතාවය අනුව පද්ධතිය නිමකර, ස්ථාපිත කිරීම ඊළඟ පියවර වේ.

සම්මත ලෙස ආකෘතීන් නිර්මාණය කිරීම සහ සම්මතකරණයට අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම.

මෙම ව්‍යාපෘතියේ පලමු අදියර ලෙස මූලික සාකච්ඡා වට කිහිපයක් අදාළ ප්‍රධාන කර්මාන්තකරුවන් සමග පවත්වන ලදි. මේ සඳහා මූලිකව අවශ්‍යවන යන්ත්‍ර හඳුනා ගෙන ඇත. ඒ අනුව, රු. මිලියන 32.5ක් වූ යන්ත්‍ර සඳහා ඇණවුම් මේ වන විට ලබාදී ඇත.

කිලෝ ග්‍රෑම් 50 ක ධාරිතාවයෙන් යුත් එළවලු විජලීකරණ යන්ත්‍රයක් නිපදවීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ තැටි විශාල ප්‍රමාණයක් ඇති විජලිකරණ, යන්ත්‍රයක, සෑම තැටියකම වියලීමේ ක්‍රියාවලිය ඒකාකාර වන සේ විජලන යන්ත්‍රයක් නිපදවීමයි.



මෙහි ඇති විශේෂත්වය නම් එළවලු වියලීම ගුණාත්මකව සිදු කිරීම හා විජලන යන්ත්‍රය වෙත නිරන්තර අවධානයක් යොමුවීම අවශ්‍ය නොවීමයි. මෙහි මූලික පර්යේෂණ සාර්ථකව නිමකර ඇති අතර මුලු ව්‍යාපෘතියෙන් 90%ක් පමණ මේවන විට නිම කර ඇත.

රථ වාහන ගාල් කිරීමේ ස්වයංක්‍රීය අධීක්ෂන පද්ධතිය

මෙම පද්ධතිය ඉලෙක්ටොනික් සංවේදක උපයෝගී කර ගෙන නිපදවා ඇත. මෙමගින් රථ ගාලට පැමිණෙන වාහන, ඉඩ පහසුකම්ඇති වාහන අංගනයක් වෙත ස්වයංක්‍රීයව යොමු කරනු ලබන බැවින් කාලය ඉතිරි වන අතර, රථ වාහන තදබදයද අවම කර ගත හැක.



මෙවැනි පද්ධතියක් නිමවා, දැනට නියාමක ව්‍යාපෘතියක් ලෙස පවත්වා ගෙන යනු ලැබේ.

වියදම් පිරිමැසුම් දායක පහසුකම් සහිත නිවාස ව්‍යාපෘතිය

වර්ග අඩි 1500ක ඉඩකඩක් ඇති, දෙමහල් නිවසක් වියදම් අවම වනසේ ඉදි කිරීම මෙම ව්‍යාපෘතියේ අභිලාෂයයි. මෙහිදී හැකිතාක් දුරට මධ්‍යස්ථානයේ වැඩි දියුණු කරන ලද තාක්ෂණයන් යොදා ගෙන ඇත. නිවසේ ව්‍යූහය, 2019 දෙසැම්බර් මස නිම කරන ලදි. 2020 පෙබරවාරි වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිමවීමට නියමිතය.



ආප්ප පිසීමේ ස්වයංක්‍රීය උඳුන



LP වායුවෙන් ක්‍රියා කරන උඳුනෙහි එකවර ආප්ප 12ක් පිසිය හැක. පැයකට ආප්ප පිසීමේ ධාරිතාවය පැයකට 260 කි.

මෙම යන්ත්‍රය ක්‍රියාකරවීම සඳහා එක් ක්‍රියාකරුවකු පමණක් ප්‍රමාණවත්ය.

මේ වන විට තාක්ෂණය පැවරීම සඳහා සූදානම් කරනු ලැබ ඇත.

ස්වයංක්‍රීයව යෝගට් ඇසුරුම් කිරීමේ යන්ත්‍රය



පැයකදී යෝගට් බඳුන් 400ක් ඇසුරුම් කල හැකි පරිදි යන්ත්‍රය නිපදවනු ලැබ ඇත. මෙහිදී, නියමිත බර අනුව, ස්වයංක්‍රීයව, බඳුන්වලට පුරවා පියන් සීල් තබා සකස් වේ.

කර්මාන්තමය පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රය

මෙම යන්ත්‍රය මගින් පැයකදී පොල් ගෙඩි 1200ක් ලෙලි ගැසිය හැක. පොල් ගෙඩියක් ලෙලි ගැසීමට, මිනිස් ශ්‍රමය ආශ්‍රිතව ගෙඩියකට රු.2.50 ක් වන අතර මෙම යන්ත්‍රය භාවිතයේදී ගෙඩියකට ශත 80 ක් පමණක් වැය වේ. තාක්ෂණය හුවමාරු කිරීම සඳහා සුදුස්සන්ගෙන් අයදුම්පත් කැඳවා තිබේ.





භ්‍රමණය කල හැකි අන්දමේ පහසු කොම්පොස්ට් බඳුනක් හඳුන්වාදීම



ඉවත දමන ලද ප්ලාස්ටික් බැරල යොදාගෙන භ්‍රමණය කල හැකි සේ කොම්පොස්ට් බඳුනක් නිර්මාණය කර ඇත. දිනකට රවුමක් හෝ 2ක් භ්‍රමණය කිරීමෙන් ඇතුලත අන්තර්ගතය හොඳින් මිශ්‍රවීම නිසා, කොම්පොස්ට් සෑදීමේ ක්‍රියාවලිය වඩා ඉක්මන් වේ.

මෙම බඳුනක් යොදාගෙන දින 30ක් තුල කොම්පොස්ට් නිපදවා ගත හැක.

මෙම ක්‍රියාවලිය සඳහා එක් නිවසකට බඳුන් 2ක් අවශ්‍ය වේ. පලමු කොම්පොස්ට් බඳුනට, දින 15 ක් යනතුරු දිරාපත් වන අපද්‍රව්‍ය කි.ග්‍රෑ. 1 – 1.5 ක් පමණ දිනකට යොදනු ලබන අතර, ඊ ලඟ දින 15 දී අපද්‍රව්‍ය නොදමන අතර දිනකට වරක් කරකැවීමෙන් මිශ්‍ර කිරීම දින 30 ක් දක්වා කරගෙන යනු ලැබේ. පලමු බඳුනට අපද්‍රව්‍ය දැමීම නැවැත්වූ පසු දෙවන බඳුනට දින 15ක් යනතුරු අපද්‍රව්‍ය යෙදිය හැක.

ලණු කැරලි (Coir Braids) නිපදවීමේ යන්ත්‍රය



ලණු පැදුරු සකස් කිරීමේදී, අවශ්‍ය වන කැරලි නිපදවීමට විශාල වශයෙන් මිනිස් ශ්‍රමය අවශ්‍ය වේ. (සමස්ත ක්‍රියාවලියන් මිනිස් ශ්‍රමයේ ප්‍රතිශතය 60% ක් පමණ වේ.) මිනිස් ශ්‍රමය යොදා නිම වන ලණු කැරලි වල ඒකාකාරී බවද විටින් විට වෙනස් වේ.

මෙම තත්වයට විසඳුමක් ලෙස මෙම යන්ත්‍රය නිපදවා ඇත. ක්ෂේත්‍ර පරීක්ෂාවන් මේ වන විට සිදු කරමින් පවතී.

8.2 බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ තාක්ෂණික සේවාවන්

2019 වසර තුලදී, මෙම දෙපාර්තමේන්තුව මගින් තාක්ෂනික සේවාවන් සැපයීම මගින් රුපියල් මිලියන 45.69 ක ආදායමක් ලබා ගැනීමට ඉලක්ක කර තිබුණි. ඒ අතරම විදුලි ලාම්පු සහ ශීතකරණ රසයනාගාර වෙනුවෙන් ISO 17025 සහතික ලබා ගැනීමටද හැකි විය.

ඊට අමතරව මෙම දෙපාර්තමේන්නතුව මේ වන විටත් ලබා ගෙන තිබූ ජාත්‍යාන්තර ප්‍රමිතීන් පවත්වා ගෙන යෑමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබූ අතර, තාක්ෂණික දැණුම ව්‍යප්ත කිරීම සඳහා 2019 වසර තුල පුවත් පත්‍රිකා 3ක් නිකුත් කර ඇත. ප්‍රධාන වශයෙන් පහත සඳහන් තාක්ෂණික සේවාවන් කර්මාන්තකරුවන් සඳහා සැපයේ

- බොයිලේරු විශ්ලේෂණ වාර්තා සහ බොයිලේරු කාර්යක්ෂමතා
- කර්මාන්තමය ක්‍රියාවලියේ මිණුම් අධීක්ෂණය කිරීම
- ශබ්ද හා වායු තත්ව මිනුම්
- පිරිපහදු පද්ධති සැළසුම්කරණය
- ශබ්ද හා වායු තත්ව පාලනය සඳහා සැලසුම් ලබාදීම
- OSHA ප්‍රමිතීන්ට අනුව අභ්‍යන්තර වායු අධීක්ෂණය
- ස්ථානීය වායු විමෝචන අධීක්ෂණ කටයුතු
- අපජලය සාම්පල පරීක්ෂා කිරීම් හා විශ්ලේෂණය
- අපජලය පිරිපහදු පද්ධති හදුන්වාදීම

බලශක්ති හා පාරිසරික සේවාවන් පිළිබඳ සාරාංශය - 2019 වසර

ව්‍යාපෘතිය	වාර ගණන	ආදායම (රු.,000)	දායකත්වය (රු.,000)
කර්මාන්තමය සේවා	501	19,120	14,688
රසායනාගාර සේවා	241	1,885	819
අපජලය පිරිපහදු පද්ධති	75	10,516	3,874
එකතුව		**31,521**	**19,321**

8.3 ව්‍යාපෘති හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කරනු ලැබූ ඉදිකිරීම් සේවා

අප ආයතනය මගින් හඳුන්වා දෙනු ලැබූ තාක්ෂණයන් මත පදනම්ව පහත සඳහන් ව්‍යාපෘතීන් වාණිජ ව්‍යාපෘතීන් ලෙස නිම කරන ලදි.

ව්‍යාපෘතිය	සංඛ්‍යාව	ආදායම (රු.,000)
සිවිල් ඉංජිනේරු උපදේශක සේවා	11	3,098
වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදිකිරීම	06	27,015
පෙර සවි / පෙර වෙර ගන්වන ලද කොන්ක්‍රීට් නිෂ්පාදනය	29	2,793
අයතනය මඟින් හඳුන්වා දෙනු ලැබූ නිෂ්පාදනයන් සහ වැඩි දියුණු කිරීම්	53	7,438

සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් නිම කරනු ලැබූ ප්‍රධාන ව්‍යාපෘතීන්

- **කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍යායතනය සඳහා වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය අනුව දේශන ශාලාවක් ඉදිකිරීම**



විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ දේශන ශාලා ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනය සඳහා (අයි.අයි.එම්.) ආසන 252 කින් යුත් අර්ධ ස්ථිර දේශන ශාලාවක් සැලසුම් කර ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කටයුතු නිම කරන ලදි. ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණය 195m2 වන අතර ව්‍යාපෘතියේ වටිනාකම රු.17,038,775.51 කි. ව්‍යාපෘතියේ මුළු කාලය දින 180 කි

- **වාද්දුව වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් උපදේශක සේවා සැපයීම**



මෙය බාහිර ප්‍රතිකාර අංශය, වෛද්‍ය නිළධාරී කාර්යාලය, ළමා සංවර්ධන ඒකකය, දන්ත වෛද්‍ය සායනය, ශ්‍රවනාගාරය හා අනෙකුත් සායනයන් අඩංගු තෙමහල් ගොඩනැගිල්ලකි.

බිම් ප්‍රමාණය 1440 m^2කින් යුත් ගොඩනැගිල්ල, නර්ඩ ආයතනයේ කොන්ක්‍රීට් කුලුණු, තලාද සහ පස්ගල් තාක්ෂණයන් යොදා නිම කිරීමට යෝජිතය.

ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 63කි. මේ වන විට ගොඩනැගිල්ලේ ව්‍යුහය නිමවා, පළමු තලාදය යොදා ඇත. උපදේශක සේවා ගාස්තුව දළ වශයෙන් රු.මිලියන 3.2කි.



- **කොන්ක්‍රීට් පාලම, ඉඳිවිටිය, ජාඇල**

ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීමකට අනුව, නර්ඩ් ආයතනයේ වියදම් පිරිමැසුම්දායක කුඩා පාලම් තාක්ෂණය යොදාගෙන ජාඇල, ඉඳිමිටියේ මෙම පාලම ඉදි කරනු ලැබ ඇත. මධ්‍යස්ථානයේ කොන්ක්‍රීට් අංගනයදී නිමවන ලද පෙරසවි කොන්ක්රීට් කඳන් යොදා ගෙන පාලම් තට්ටුව නිමකර ඇත. මෙම පාලමේ, අතරමැද එක් ආධාරයක කුලුණක් පමණක් භාවිතා කරනු ලැබ ඇත. වැය වූ මුදල - රු.මිලියන 2.5 කි.

.





- **කොන්ක්‍රීට් පාලම ඉලුක්පොත, පාලින්ද නුවර**

IUCN (International Union for Conservation of Nature) ආයතනයේ ඉල්ලීම මත, ප්‍රදේශවාසින්ගේ ද සහභාගිත්වය ඇතිව මෙම පාලම, කළුතර දිස්ත්‍රික්කයේ ඉලුක්පොත ග්‍රාමයේ ඉදි කරන ලදි. වැය වූ මුදල රු.මිලියන 2.1කි.





- **කොන්ක්‍රීට් පාලම, පතිරගොඩ පාර, රත්මලාන**

පිරිවැය රු. මිලියන 1.3 කි. නර්ඩ් ආයතනයේ කොන්ක්‍රීට් අංගනයේ නිමවන ලද පෙර සවි ගැන්වූ කොන්ක්‍රීට් කඳන්, පාලමේ තට්ටුව සෑදීමට යොදා ගන්නා ලදි.





8.4 තාක්ෂණ අලෙවි දෙපාර්තමේන්තුව වසින් සිදු කරනු ලැබූ තාක්ෂණ පැවරුම් සහ තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම්

මධ්‍යස්ථානය විසින් හඳුන්වාදෙන ලැබූ නිෂ්පාදන හා සේවා බලපත්‍රලාභීන් වෙත පැවරීම හා එම තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන්, තාක්ෂණ අලෙවි දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරයද මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ.

2019 වසරේදී තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් පරිදි තාක්ෂණ, පැවරුම් හා ප්‍රවර්ධන ක්‍රියාවන් හී නිරත වී ඇත.

ක්‍රියාකාරකම්	සංඛ්‍යාව
නව තාක්ෂණ පැවරුම් බලපත්‍ර	28
පැවරුම් බලපත්‍ර අළුත් කිරීම	69
නව තාක්ෂණයන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම	07
ප්‍රදර්ශන හා වෙළඳ කුටි පැවැත්වීම	10
දැනුවත් කිරීමේ වැඩ සටහන්	06
ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන්	05
පුවත්පත් හා සඟරා සඳහා ලිපි යොමු කිරීම්	06
පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම්	03
කුඩා කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡා වට	01

තාක්ෂණික ඉන්කියුබේටරය මගින් සිදු කරනු ලැබූ සේවාවන්



කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 23 දෙනෙකු සඳහා නිරවද්‍ය යන්ත්‍රෝපකරණ ත්‍රිමාණ මුද්‍රණය සහ අච්චු යන්ත්‍රණය සිදු කර ඇත. පාසැල් ළමුන් දෙනෙකු ඇතුළුව නව නිපැයුම්කරුවන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපකාරක සේවාවන් සපයා ඇත.

මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට සම්බන්ධ ව්‍යාපෘති 03 කට අදාළව තාක්ෂණික උපකාරක සේවා ලබාදී ඇත.

ශිල්පසේනා ප්‍රදර්ශනය - කොළඹ (BMICH)

ශිල්පසේනා ප්‍රදර්ශනය කොළඹ BMICH හි (2019 ජූලි 17 සිට ජූලි 21 දක්වා) පැවැත්වූ අතර එහි සමාරම්භය අග්‍රාමාත්‍ය ගරු. රනිල් වික්‍රමසිංහ මහතා විසින් සිදු කරන ලදි. මෙම ප්‍රදර්ශනයේදී මධ්‍යස්ථානය නියෝජනය කරනු ලැබූ තේමාව වූයේ මෙකට්‍රොනික්ස් ඉංජිනේරු ක්ෂේත්‍රයයි.

ශිල්පසේනා ප්‍රදර්ශනය - පොළොන්නරුව

පොළොන්නරුවේදී පැවති මෙම ප්‍රදර්ශනයේදී “පුරාතන තාක්ෂණයන්” යටතේ වූ කලාපයේ සංවිධානය කරන ලද්දේ නර්ඩ ආයතනය මඟිනි. මෙහිදි බලශක්ති හා පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව මූලිකත්වය ගෙන කටයුතු කරන ලදි.

9



2019 වසරේදී ලබාගත් සම්මාන හා ජයග්‍රහණ



ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් පිරිනමනු ලබන **ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ (පර්යේෂණ ආයතන) 2017 වර්ෂයේ හොඳම වාර්ෂික වාර්තාව සහ ගිණුම් සඳහා වූ සම්මානය** 2019 ඔක්තෝබර් 25 වන දින නර්ඩ් මධ්‍යස්ථානය වෙත හිමි විය.



රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද **ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී සේවා අංශය (මහා පරිමාණ) සඳහා වූ විශේෂ ඇගයීම් සම්මානයක්** නර්ඩ් මධ්‍යස්ථානය වෙත 2019 මාර්තු 26 දින පිරිනමන ලදි.



SLAB
SRI LANKA ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Refrigerator Testing Laboratory
Energy & Environmental Services Department
National Engineering Research & Development Centre

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2005, has been accredited as a testing laboratory under the field of

ELECTRICAL TESTING

and has been assigned the accreditation number
TL 060-02

This certificate is issued on 30 October 2019 and is valid until

30 November 2020

The accreditation was granted for the first time on 30 October 2019

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

මධ්‍යස්ථානයේ බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති ශීතකරණ පරීක්ෂණාගාරය විදුලි පරීක්ෂණ ක්ෂේත්‍රයේ ISO / IEC 17025: 2005 හි නිර්ණායකයන්ට අනුකූල බවට තහවුරු කරමින් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් 30 දින සිට 2020 නොවැම්බර් 30 දක්වා වලංගු වන පරිදි ඉහත සහතික පත්‍රය පිරිනමා ඇත.



SLAB
SRI LANKA ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Lamp Testing Laboratory
Energy & Environmental Services Department
National Engineering Research & Development Centre

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2005, has been accredited as a testing laboratory under the field of

ELECTRICAL TESTING

and has been assigned the accreditation number
TL 060-03

This certificate is issued on 30 October 2019 and is valid until

30 November 2020

The accreditation was granted for the first time on 30 October 2019

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

මධ්‍යස්ථානයේ බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති විදුලි ලාම්පු පරීක්ෂණාගාරය විදුලි පරීක්ෂණ ක්ෂේත්‍රයේ ISO / IEC 17025: 2005 හි නිර්ණායකයන්ට අනුකූල බවට තහවුරු කරමින් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් 30 දින සිට 2020 නොවැම්බර් 30 දක්වා වලංගු වන පරිදි ඉහත සහතික පත්‍රය පිරිනමා ඇත.

10

සුභසාධන හා ආගමික කටයුතු



ආයතනික කාර්ය මණ්ඩලයේ අන්තර් පුද්ගල සබඳතා, සහයෝගීතාවය, කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීම, ආයතනික පොදු කටයුතු සඳහා දක්වන කැපවීම යනාදිය වර්ධනය කරලීමේ අරමුණින් සේවක සුභසාධක හා ආගමික වැඩසටහන් මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වේ. ඒ අනුව, 2019 වර්ෂයේදී මධ්‍යස්ථානයේ සේවක සුභසාධක සංගමය හා ආගමික සංගම් විසින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සාරාංශ ලෙස පහත සඳහන් පරිදි වේ.

10.1 සුභසාධක සංගමය

2019 වර්ෂය තුලදී මධ්‍යස්ථානයේ සුභසාධක සංගමය විසින් කාර්යමණ්ඩලයේ සියළු දෙනාගේ සහභාගීත්වයෙන් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2019 අගෝස්තු 31 වන දින මොරගාකන්ද සහ දඹුල්ල ප්‍රදේශයන්හි විනෝද චාරිකාවක් චාරිකාවක් සංවිධානය කිරීම.

- ආයතනයේ පුරෝගාමී සභාපතිවරයෙකු වූ විද්‍යාජෝති ඒ.එන්.එස් .කුලසිංහ මැතිතුමාගේ ජන්ම දිනය නිමිත්තිකරගෙන වාර්ෂිකව පවත්වනු ලබන ලේ දන්දීමේ වැඩසටහන 2019.10.25 දින සංවිධානය කිරීම.
- 'රහ නලු ගී' නමින් සිංහල නාට්‍ය ගීත ඇතුලත් සංගීත වැඩසටහනක් 2019.12.16 දින මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරය දී පැවැත්වීම.

10.2 ආගමික සංගම්

බෞද්ධ සංගමය හා කතෝලික සංගමය යන සංගම් දෙක මධ්‍යස්ථානය තුල ආගමික කටයුතු සම්බන්ධයෙන් ප්‍රමුඛව ක්‍රියාත්මක වේ. මධ්‍යස්ථානයේ සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාත්මීය හා මානසික සංවර්ධනය සඳහා විවිධ වූ වැඩසටහන් මෙම සංගම් දෙකෙහි පුරෝගාමීත්වයෙන් සිදු කරනු ලැබේ. මධ්‍යස්ථානයේ සෑම සේවකයෙකුම ස්වේච්ඡාවෙන් මෙම සංගමයක සාමාජිකත්වය හිමිවීම විශේෂත්වයකි.

එම සංගම් 2019 වර්ෂය තුලදී පහත සඳහන් ආගමික හා සමාජ සත්කාර ක්‍රියාකාරකම්හි නිරතව ඇත.

10.2.1 බෞද්ධ සංගමය

- මධ්‍යස්ථානයේ නව වසරේ කටයුතු ඇරඹීම නිමිත්තෙන් 2019.01.01 දින සෙත් පිරිත් සජ්ඣායනයක් පැවැත්වීම
- පූජ්‍යපාද පොල්පිති මූකලානේ ප්‍රඥ්ඤාසිරි ස්වාමීන්වහන්සේ විසින් 2019.02.26 දින සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- 2019.03.30 දින කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් සල්ගල අරණ්‍ය සේනසනාසනයෙහි භාවනා වැඩසටහනක් සංවිධානය කිරීම
- හැඳල දමිත ස්වාමීන්වහන්සේ විසින් 2019.05.15 දින සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- 2019 ඔක්තෝබර් 19 සහ 20 දිනයන් වල හොරොව්පාතන ඔලුගස්කදවල විහාරස්ථ රාජමහා විහාරයේ කඨින පිංකම සඳහා ප්‍රධාන අනුග්‍රහය දැක්වීම සහ ඒ සඳහා සහභාගී වීම.
- වාර්ෂිකව සිදු කරනු ලබන ජාඇල, වැලිගම්පිටිය ජයවර්ධන ළමා නිවාසයේ දරුවන් සඳහා දිවා ආහාරය හා පරිත්‍යාගයන් 2019.10.25 සිදුකිරීම.

10.2.2 කතෝලික සංගමය

- කාර්යමණ්ඩලය සහ ඔහුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2019 ඔක්තෝබර් 05 සහ 06 දිනයන්හි මඩු දේවස්ථානයේ වන්දනා චාරිකාවක් සංවිධානය කිරීම.
- ආයතනයේ වාර්ෂිකව පවත්වනු ලබන නත්තල් දේව මෙහෙය 2019.12.22 දින මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීම.



11

2019 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාලෝචනය

11.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 මූල්‍ය වාර්තා පිළියෙල කරන පදනම

සමාලෝචිත වර්ෂය ලෙස සලකා ඇත්තේ 2019.01.01. සිට 2019.12.31 කාලපරිච්ඡේදයය.

1.2 අගය කරලීම හා ගිණුම්ගත කරන පදනම

මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම හා ඓතිහාසික පිරිවැය සංකල්ප මත පදනම්වය.

1.3 ගණුදෙණු ක්‍රියාත්මක වූ හා ඉදිරිපත් කරන මූල්‍ය ඒකකය

මෙම මෙම ප්‍රකාශයන්හි පිළිබිඹු වන ගණුදෙණු සිදු කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ මෙම මධ්‍යස්තානය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි භාවිතා වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ නොවන අවස්ථාවකදී ඒ පිළිබඳ වෙනම දක්වා ඇත.

1.4. සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ 2019.12.31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදයටය. මෙහිදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් පරිවර්ථන කාලපරිච්ඡේදය හා සැසඳිය හැකි වනු ඇත.

1.5 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චය කරලීම, ඇස්තමේන්තු හා උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති, වත්කම්, වගකීම්, ආදායම්, අසම්භාව්‍ය වගකීම් හඳුනාගැනීම් සම්බන්ධයෙන් කළමණාකරණ විනිශ්චය කරලීම් ඇස්තමේන්තුගත කරලීම හා උපකල්පනයන් භාවිතා කර ඇත. කෙසේ නමුත් උපකල්පනයන් හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවයන් මත ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක ගැලපීම් ඉදිරි කාලපරිච්ඡේදයක සිදු විය හැක. මෙහිදී මධ්‍යස්ථානයේ ඉදිරි අනාගත අඛණ්ඩ පැවැත්ම හා සම්පත් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කළමණාකාරිත්වය නිසි ඇගයීමක පිහිටා ඇත. තවදුරටත් මධ්‍යස්ථානයේ පැවැත්ම පිළිබඳව බලපාන අවිනිශ්චිත තත්වයක් හෝ සැකයක් කළමණාකාරිත්වය වෙත නොමැත. මෙනිසා මූල්‍ය ප්‍රකාශ සාදා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මතය.

2. දේපල හා පිරියත

2.1 හඳුනාගැනීම හා මැනීම

පිරියත ලෙස ගෙන ඇත්තේ සෘජුව මිළදී ගැනීම් සඳහා අදාල වන වියදම්ය. මධ්‍යස්ථානය විසින්ම ගොඩ නංවා ගනු ලැබූ වත්කම්වල පිරිවැය ලෙස ඒවායේ අභිලාෂගත අරමුණු ඉටුවන මට්ටම දක්වා දරණ ලද අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා අනෙකුත් සෘජුව හඳුනාගත හැකි වියදම් පිරිවැය ලෙස සලකනු ඇත. ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ ගොඩනැංවීම් වලදී ගොඩනැගිලි ඉවත්කරලීම් පිරිවැය හා අදාල පරිදි ණය පොලී පිරිවැය ප්‍රාග්ධනිත කරනු ඇත. යම් ප්‍රාග්ධන භාණ්ඩයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස මෘදුකාංග පවතින විට එම මෘදුකාංග පිරිවැය අදාල භෞතික උපකරණය සමඟම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධන භාණ්ඩවල අනුයුක්ත කොටස් සඳහා වෙන වෙනම වූ ඵලදායී ජීවිත කාලයක් ඇති අවස්ථාවකදී එම භාණ්ඩයන් වෙන වෙනම හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් බැහැර කරලීමේ දී ජනිත වන ලාභ හෝ අලාභ හඳුනා ගැනෙන්නේ එම වත්කමේ විකුණුම් මිළ හා පොත්වල ඇති ශුද්ධ අගය සැසඳීමෙනි. මෙම උපලබ්ධි ලාභය/අලාභය අමතර ආදායම් හෝ අමතර වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හරලන අවස්ථාව වන විටදී ඒ හා අදාල අගයක් ප්‍රත්‍යාගණන සංචිතය තුල පවතින්නේ නම් එය ඉදිරියට ගෙනා රදවාගත් ඉපැයුම් ශේෂය සමග ගැලපේ.

2.2 ප්‍රත්‍යාගණනය

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම සඳහා දේපල හා පිරියත සමගාමීව ප්‍රත්‍යාගණනය කරනුයේ එකම කාණ්ඩයට අයත් වත්කම් තෝරාගෙන වටිනාකම හා දින අතර ඇති වෙනස ඉවත් කිරීමටය.

වත්කම් කාණ්ඩවල ප්‍රත්‍යාගණනය පෙරෙලෙන පදනමක් යටතේ ප්‍රත්‍යාගණනය කරනුයේ වත්කම් කාණ්ඩ වල අගය සුලු කාලයක් ඇතුලතදී යාවත්කාලීන කිරීමටය.

දේපල හා පිරියත වල සාධාරණ අගය සාමාන්‍යයෙන් නිර්ණය කරන්නේ වෙළඳ අගය පදනම් කරගෙනය. වත්කම් වල ඇගයීම් සිදු කරනු ලබන්නේ අගයන් පිළිබඳ වෘත්තීමය දැනුමක් ඇති කණ්ඩායමක් විසිනි. වත්කම් වැඩි ප්‍රමාණයක සාධාරණ අගය ගනු ලබන්නේ වෙළඳපොලේ සඳහන් මිල අනුවය.

ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩ වල අගයෙහි වැඩිවීමක් ලැබූ විට එය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස පෙන්වයි. කෙසේ වෙතත් ඌනතාවයක් පෙන්නුම් කරන අවස්ථාවේදී අතිරික්තය සමතුලිත වන සේ ඌනතාවය කපා හැරේ. ප්‍රත්‍යාගණන අතිරික්තය එකම කාණ්ඩයක් යටතේ ඇති වත්කම් වලින් කපා හැරීම මිස වෙනත් කාණ්ඩයක ඇති අතිරික්ත වලින් කපා හැරීම සිදු නොකෙරේ.

2.3 ක්ෂය කරලීම

වත්කම් ක්ෂය කරලීම වත්කම් වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කරලීමෙන් අනතුරුව එන අගය මත පදනම් වනු ඇත. යම් වත්කමක් සංයුතියෙහි ඇති ප්‍රමාණාත්මක වැදගත් අංශයන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය විවිධ වන අවස්ථාවලදී ඒවා වෙන වෙනම ක්ෂය කරලීමට භාජනය කරනු ඇත. වත්කම් වල ක්ෂය ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය තුල ලාභාලාභ ගිණුමෙහි පෙන්වනු ඇත. සලකා බලන වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී මෙම ඇස්තමේන්තුගත අනුපාතයන් පහත පරිදිය.

වත්කම් කාණ්ඩය	ක්ෂය%
ගොඩනැගිලි	2.5
කාර්යාල උපකරණ	15
උපකරණ	15
ප්‍රදර්ශන භාණ්ඩ	15
පරිඝණක යන්ත්‍ර	331/3
රථ වාහන	15
ලී බඩු උපකරණ	10
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම්	15
පුස්තකාල පොත්	05
යටිතල පහසුකම්	15
මෘදුකාංග	33 1/3

2.4 පොත්වලින් ඉවත්කරලීම

වත්කමක ගෙන යන අගය පොත්වලින් ඉවත්කරලීම එහි අනාගත ඇස්තමේන්තුගත ප්‍රතිලාභ නොමැති විටදී හෝ එය ඉවත් කරනු ලබන විටකදී සිදු කරනු ඇත. වත්කම් බැහැර කරන අවස්ථාවකදී සිදුවන ලාභ හා පාඩු, වත්කම් වල විකුණුම් අගය හා ශුද්ධ අගය අතර වෙනස සැසඳීමෙන් ගන්නා අතර එය මෙහෙයුම් වාර්තාවන්හි අනෙකුත් ආදායම් යටතේ දක්වනු ඇත.

2.5 අස්පෘශ්‍ය වත්කම්

මධ්‍යස්ථානය විසින් අත්පත් කරගන්නා ලද නිශ්චිත ජීවන කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අගය කරනු ලබන්නේ පිරිවැයෙන් ඒවායේ ක්‍රම ක්ෂය හා මුලු අගය අඩුවීම්ද ගැලපීමෙනි. අනතුරුව ලැබෙන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම නිසා අදාල අස්පෘශ්‍ය වත්කමෙහි අනාගත ප්‍රතිලාභ ලැබීම වර්ධනය වන ස්වරූපයක් ඇති නම් පමණි. ක්‍රම ක්ෂය කරනු ලබන්නේ පිරිවැය හා අවශේෂ අගය අතර වෙනසටය. ක්‍රම ක්ෂය අගය මෙහෙයුම් ප්‍රකාශයන්හි සරල මාර්ග ක්ෂය ක්‍රමයට අදාල අනුපාතය මත පෙන්නුම් කෙරේ. හායනය කරනු ලබන්නේ අස්පෘෂ්ය වත්කම මධ්‍යස්ථානයේ භාවිතයට ගත් දින සිටය. අස්පෘෂ්ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනුපාතයන් සමාලෝචිත වර්ෂයන් හා සංසන්දනාත්මකව පහත දී ඇත.

- මෘදුකාංග - 33 1/3 %

හායන වර්ෂයන් ඵලදායී ජීවිත කාලය හා අන්ත අගය සෑම කාලපරිච්ඡේදකදීම සමාලෝචනය කරනු ඇත.

3. තොග

තොග අගය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අවමය සලකාය. තොග පිරිවැය FIFO තොග නිකුත් කරලීමේ මූලධර්ම මත පදනම්ව ඇත. තොගයන් වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරනු ලැබූ වියදම් ඒවායේ පිරිවැය ලෙස ඇත.

රසායනාගාර තොග හා කෙරීගෙන යන වැඩ ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අඩු අගයට ගෙන ඇත.

4. ලැබිය යුතු වෙළඳ ශේෂ

වෙළඳ ශේෂ ප්‍රථමයෙන්ම සාධාරණ අගය මත පදනම්ව හඳුනා ගැනේ. අනතුරුව එලදායී පොලී අනුපාතය මත අගය හීනවීම වට්ටම් කරලීම හා අගය පිරිහීම මත වෙන් කරලීමක්ද කරනු ලැබේ.

5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගනු ලබන්නේ අතැති මුදල්, බැංකු මුදල්, තාවකාලික කැඳවුම් තැන්පතු හා රාජ්‍ය ආයතනවල අතිරික්ත තැන්පතු ගිණුම්ය.

6. දෙන ලද ණය හා ලැබිය යුතු ගිණුම්

යම්කිසි ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සිදු කරන හා වෙළඳපොල තුල සංසරනය නොවන ණය දීම් මුලින්ම සාධාරණ අගය හා සෘජුව ස්ථාපනය කල හැකි වියදම් මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

7. මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්නයන් නොවන මූල්‍ය මය වගකීම් අනෙකුත් මූල්‍ය මය වගකීම් ලෙස හඳුනා ගැනේ. මෙම අනෙකුත් මූල්‍ය මය වගකීම් ලෙස නියෝජනය වන්නේ වෙළඳ ගෙවිය යුතු ගිණුම් හා සම්බන්ධිත පාර්ශවයනට කල යුතු ගෙවීම්ය. මෙම වගකීම් ප්‍රථමයෙන්ම හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට යම් සෘජුව හඳුනාගත හැකි පිරිවැය ගැලපීමෙනි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් එකිනෙකට හිලව් කර පෙන්වනු ලබන්නේ මධ්‍යස්ථානයට ඒ සඳහා නීතිමය අයිතියක් පවතින්නේ නම් පමණි.

8. සේවක ප්‍රතිලාභ වගකීම්

සේවය හැරයාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ ව්‍යවස්ථාපිතව දක්වා ඇති පරිදි සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මධ්‍යස්ථානයේ දායකත්වය පිළිවෙලින් 15% හා 3% ක් වේ. 1983 අංක 12 දරණ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කර ඇත. පාරිතෝෂික වෙන්කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ. මෙම පාරිතෝෂික වෙන්කරලීම පහත පරිදි ගනනය කෙරේ. (අවසන් වරට ගත් මූලික වැටුප + ජීවන වියදම් දිමනාව සහ අනෙකුත් අදාල දීමනා /2 x සම්පූර්ණ කර ඇති වර්ෂ ගණන)

9. වෙන්කරලීම්

මින් නියෝජනය වන්නේ අතීතයේදී ඇතිවුනු සිද්ධියක් මත මධ්‍යස්ථානය වෙත වර්තමානයේදී හඳුනාගත හැකි නීතිමය හෝ එලදායි ස්වරූපයේ බැඳීම් මත විශ්වාසනීයව පූර්වකථනය කරගත හැකි අනාගත මූල්‍ය පිටතට ගලා යාමය.

10. වෙන්කරලීම්, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්

ශේෂපත්‍ර දිනට මධ්‍යස්ථානය වෙත ඇති ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත හැකි, අනාගත සම්පත් පිටව යාමක් විය හැකි බැදියාවන් සඳහා වෙන් කරලීම් තබනු ඇත. අසම්භාව්‍ය වගකීම් සඳහා ශේෂ පත්‍රයේ සටහන් ලෙස දක්වා ඇත.

11. ආදායම් හඳුනා ගැනීම

යම්කිසි ආදායමක් විශ්වාසවන්තව ගණනය කලහැකි නම් හා ඊට අදාල ආර්ථික ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත හැකියාවක් ඇති අවස්ථාවේදී ආදායම් හඳුනා ගැනේ. ලැබී ඇති හා ලැබීමට ඇති අගයන්ගේ සාධාරණ අගයට වට්ටම් හා බදු ඉවත් කරලීමෙන් ආදායම් හඳුනා ගනී. ආදායම් හඳුනා ගැනීමේදී පහත දැක්වෙන විශේෂ ලක්ෂණයන් පදනම් කරගෙන ඇත.

a) සංවර්ධිත තාක්ෂණයන් විකිණීම

අදාල තාක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව ප්‍රතිලාභයේ හා අවදානමේ හිමිකාරිත්වයේ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී. පවරනු ලැබූ තාක්ෂණයන් සම්බන්ධයෙන් පසු කාලින කළමණාකාරිත්ව හෝ පාලන මැදිහත් වීමක් මධ්‍යස්ථානය දරණු නොලැබේ.

b) සේවා සැපයීම

සේවා ආදායම හඳුනාගනු ලබනුයේ අදාළ සේවාව ජනනය වූ හෝ කරනු ලැබූ කාල පරිච්ඡේදයටය.

c) කොන්ත්‍රාත් ආදායම

කොන්ත්‍රාත්තුවක ආදායම එහි සමස්ථ ප්‍රතිඵලය විශ්වාසනීයව අගය කල නොහැකි විටකදී කර ඇති වැඩ ප්‍රතිශතය මත ලබා ගනී.

d) බදු

ව්‍යවස්ථාපිතව මධ්‍යස්ථානය ගෙවිය යුතු වන ආදායම් බදු එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු යනාදිය අදාල ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවනු ලැබේ.

e) පොලී ආදායම

උපචිත වන අවස්ථාවේදී පොළී ආදායම හඳුනා ගනී.

f) ජංගම වත්කම් බැහැර කරලීමෙන් ජනිත වන ලාභ හා අලාභ

ජංගම නොවන වත්කම් වල විකුණුම් මිලෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය හා ඒවා බැහැර කරලීමට කරනු ලබන අනෙකුත් ව්‍යයදම් ද අඩු කරලීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය ආදායම ප්‍රකාශනයට ගනු ලැබේ. තවද ප්‍රමාණාත්මක වශයෙන් අඩු අගයකින් සමන්විත ජංගම නොවන වත්කම් වල ඉවත් කරලීම එකිනෙකට වෙන වෙනම නොව පොදුවේ ශුද්ධ අගය දක්වනු ලැබේ.

g) අනෙකුත් ආදායම්

අමතර ආදායම් ලෙස තාක්ෂණික පැවරුම් කටයුතු වල ශුද්ධ ලාභය, කැඳවුම් තැන්පතු හා බැදුම්කර පොලී ආදායම කාල ප්‍රමාද දඩ මුදල්, ලබා දී ඇති ණය වලට පොලී, නැවත නොගෙවන තැන්පතු, සැපයුම්කරුවන් ලියාපදිංචි කරලීම, සුළු ආදායම්, හානි වූ තොග විකුණුම්, ජංගම නොවන වත්කම් බැහැර කරලීම් ආදායම හා පොදු කාර්ය අයකර ගැනීම ආදිය ඇතුලත් වේ.

h) විලම්භීත ආදායම

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් අත්පත් කර ගන්නා ජංගම නොවන වත්කම් වලට අදාල ක්ෂය වෙන් කරලීම් වලින් විලම්භීත ආදායම සමන්විත වේ.

12. ප්‍රදානයන්

ප්‍රදානයන් ලෙස ආදායම් ප්‍රකාශන වල දක්වනු ලබන්නේ ලැබීම සඳහා සාධාරණ සහතික වීමක් ඇති හා ලබා ගැනීම උදෙසා මධ්‍යස්ථානය විසින් සියළුම කොන්දේසි සපුරා ඇති විටකදිය. ප්‍රදානයන් ලැබීමේදි එය අදාළ කාල පරිච්ඡේදයේදි ආදායමක් ලෙස සලකා එමගින් ආවරණය වන ව්‍යදම් සමඟ ගලපා ඇත. යම්කිසි ස්ථාවර වත්කමක් ලබා ගැනීම සඳහා අදාළ වන පරිදි ලැබී ඇති ප්‍රදානයන් මත විලම්භීත ආදායම් ගණනය කෙරේ. මධ්‍යස්ථානයට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබීමේදී සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

13. වියදම්, ආදායම් ප්‍රනාශනයන්හි ඉදිරිපත් කරලීම

ආදායම් ප්‍රකාශන වලදි ආදායමට අදාලව ජනනය වී ඇති වියදම සමඟ ගලපා ඇත. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාමේ වියදම්, ජංගම නොවන වත්කම් වලට සම්බන්ධ ක්ෂය වැනි ආදායමට එරෙහිව ගොඩනැගෙන්නා වූ වියදම සලකනු ඇත.

14. පර්යේෂණ හා සංවර්ධන වියදම

පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රමුඛතම මූල්‍ය කරණය භාණ්ඩාගාරය මගින් ඉටු කෙරේ. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් යම් සේවාදායකයෙකු විසින් මූල්‍ය කරණය තරනු ලබන විට එහි පිරිවැයට එරෙහිව ආදායමක් ලෙස සටහන් කරනු ඇත. පිරිවැය ලෙස සෘජු පිරිවැය පමණක් සලකනු ඇත.

15. විද්‍යුත්, Mechatronics ආදී ක්ෂේත්‍රයන්හි නිපැයුම් සංවර්ධනය,

SPTF යනු ඉදිරියේදී ස්වාධීන, ලාභ චේතනාවෙන් තොර රාජ්‍ය ආයතනයක් බවට පරිවර්තනය කරනු පිණිස NERD මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතියකි. මෙතුලින් අනාගතයේදී ශ්‍රී ලංකාව තුල විද්‍යුත්, Mechatronics ආදී ක්ෂේත්‍රයන්හි නිපැයුම් නිර්මාණය, සංවර්ධනය, Prototyping පරීක්ෂාකරලීම් හා සහතික කරලීම් පහසුකම් ලබා ගත හැක.

මෙම ව්‍යාපෘතියෙහි මූලික අභිප්‍රාය වනුයේ අපනයනාභිමුඛ, දේශීය උසස් තාක්ෂණ නිපැයුම් වර්ධනය කරලීම තුලින් රටේ දල දේශීය නිෂ්පාදනයෙහි වර්ධනයක් ඇති කරලීමය.

තවද, දේශීය ඉහල තාක්ෂණය භාවිතා කරන නිෂ්පාදිතයන් උත්පාදනය හා බලපත්‍රලාභී නිපැයුම්වල අගය ඉහල නැංවීමේ දාමයක් ගොඩනැංවීමද පරමාතයකි.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජා ඇල

11.2 2019.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය (මූල්‍ය ඒකකය - රුපියල්)

විස්තරය	2019	2018 යලි සැකසූ
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	126,339,546.05	140,354,049.19
වෙළඳ ණය ගැතියෝ	17,618,309.74	17,546,162.92
තොග	14,791,984.43	11,785462.57
කලින් ගෙවීම්	795,300.70	738,034.98
වෙනත් ජංගම වත්කම්	27,498,948.47	26,568,648.77
	187,044,089.39	196,992,358.43
ජංගම නොවන වත්කම්		
දේපල හා පිරියත	521,347,850.51	553,579,806.6245
අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්	387,968.45	368,195.45
වෙනත් ජංගම නොවන වත්කම්	29,521,179.60	26,096,072.67
	551,256,999.56	580,044,074.74
මුළු වත්කම්	738,301,088.95	777,036,433.17
බැරකම්		
ජංගම බැරකම්		
වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු දෑ	47,918,927.60	52,448,519.66
මුළු ජංගම බැරකම්	47,918,927.60	52,448,519.66
ජංගම නොවන බැරකම්		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	111,340,048.00	103,094,433.50
සුරක්ෂිත තැන්පතු	6,200.00	6,200.00
මුළු බැරකම්	111,346,248.00	103,100,633.50
ශුද්ධ වත්කම්	159,265,175.90	155,549,153.16
	579,035,913.05	621,487,280.01
ශුද්ධ වත්කම්/ස්කන්ධය		
විලම්භීත ආදායම්	127,550,154.78	140,353,874.58
රජයේ ප්‍රාග්ධන ප්‍රධානයන්	193,166,313.43	211,475,012.24
ප්‍රත්‍යාගනන සංචිතය	525,029,579.04	525,008,739.75
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)	(266,710,134.20)	(255,350,346.56)
ශුද්ධ වත්කම්/ස්කන්ධය	579,035,913.05	621,487,280.01

මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ සභාපති	ඉංජී.ඩී.ඩී. ආනන්ද නාමල් අධ්‍යක්ෂ ජනරාල්	ඩී.වී.එස්. පෙරේරා අධ්‍යක්ෂිකා මුදල්

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

11.3 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්ය පදනම මත විදහා පෑම

(මූල්‍ය ඒකකය - රුපියල්)

විස්තරය	2019	2018 යලි සැකසූ
අයභාරය		
අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් හුවමාරු	280,152,034.89	277,620,000.00
විලම්භිත ආදායම්	64,656,358.72	64,155,104.67
අනෙකුත් අයභාරය	44,632,874.50	48,463,526.79
මුළු අයභාරය	389,441,268.11	390,238,631.46
වියදම්		
පරිපාලන පිරිවැය	304,527,919.34	274,184,936.49
අනෙකුත් වියදම්	25,879,703.01	35,504,960.44
ක්ෂය	70,338,193.40	69,826,999.97
මූල්‍ය වියදම	55,240.00	91,958.69
මුළු වියදම	400,801,055.75	379,608,855.59
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)	11,359,787.64	10,629,775.87

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

11.4 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(මූල්‍ය ඒකකය - රුපියල්)

විග්‍රහය	2019	2018යලි සැකසූ
මෙහෙයුම් මත ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
සාමන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ අතිරික්තය/ඌනතාවය	(11,359,787.64)	10,629,775.87
මුදල් නොවන වෙනස්වීම්		
ක්ෂයවීම්	70,338,193.40	69,826,999.97
අඩමාන ණය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම	-	-
විලම්භිත ආදායම් (වැඩිවීම්/ අඩුවීම්)	(64,656,358.72)	(64,155,104.67)
ගෙවිය යුතු වියදම් වල වැඩිවීම්/ අඩුවීම	(5,375,898.76)	5,439,106.68
සේවක පිරිවැය (වැඩිවීම්/ අඩුවීම්)	9,091,921.50	5,796,394.14
දේපල හා යන්ත්‍රෝපකරණ විකුණුම් (ලාභ/පාඩු)	1,674,516.34	1,321,844.68
අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම්/ අඩුවීම්)	(7,419,194.21)	27,551,641.24
ලැබීම්වල (වැඩිවීම්/ අඩුවීම්)	(72,146.82)	(15,191,964.57)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	(7,778,754.91)	41,218,693.34
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිළට ගැනීම්	(39,785,925.17)	(80,818,492.37)
පිරියත හා උපකරණ විකුණුම්	6236.83	12,816.69
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(39,779,,688.34)	(80,805,675.68)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	33,543,940.11	34,900,000.00
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලද අරමුදල්	-	8,524,567.15
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	33,543,940.11	43,424,567.15
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්)	(14,014,503.14)	3,837,584.81
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	140,354,049.19	136,516,464.38
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	126,339,546.05	140,354,049.19

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

11.5 2019.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

(මූල්‍ය ඒකකය - රුපියල්)

	ආරම්භක ප්‍රාග්ධනය	රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	යලි සැකසූ විලම්භීත ආදායම්	අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය	යලි සැකසූ ප්‍රත්‍යාගණන සංචිතය	යලි සැකසූ සමුච්චිත ලාභ/ අලාභය	මුළු ශුද්ධ ස්කන්ධය	2018.12.31 දිනට යලි සැකසූ ශේෂය
2018.01.01 දිනට ශේෂය	1,000,000.00	97,299,792.87	125,705,996.60	148,553,,634.87	525,008,739.75	(265,980,122.43)	631,588,041.66	622,026,890.80
2018 වර්ෂයේ වත්කම් ස්කන්ධයේ වෙනස්කම්								
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්-භාණ්ඩාගාරයෙන්								
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන්								
ලද අරමුදල් ලද ප්‍රාග්ධන ප්‍රදානයන්		34,900,000.00					34,900,000.00	37,997,000.00
විලම්භීත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන								
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							8,524,567.15	35,570,540.88
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය								
2018.12.31 දිනට ශේෂය		8,524,567.	14,647,877.98				(64,155,104.67)	(57,860,922.57)
		(78,802,982.65)						
2019 වර්ෂයේ ස්කන්ධයේ වෙනස්කම්						10,629,775.87	10,629,775.87	(6,077,467.45)
ලද ප්‍රාග්ධන ප්‍රදානයන් - භාණ්ඩාගාරයෙන්								
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන්								(68,000.00)
ලද අරමුදල්								
	1,000,000.00	61,921,377.37	140,353,874.58	148,553,634.87	525,008,739.75	(255,350,346.56)	621,487,280.01	631,588,041.66
විලම්භීත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන								
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)								
		33,543,940.11					33,543,940.11	43,424,567.15
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය								
2019.12.31 දින ඉදිරියට ගෙන ගිය ශේෂය							-	-
		(51,852,638.92)	(12,803,719.80)				(64,656,358.72)	(64,155,104.67)
					20,839.29	(11,359,787.64)	(11,359,787.64)	10,629,775.87
					-		20,839.29	
	1,000,000.00	43,612,678.56	127,550,154.78	148,553,634.87	525,029,579.04	((266,710,134.20)	579,035,913.05	621,487,280.01

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

11.6 2019.12.31 දිනට ගිණුම්කරන සටහන්

1. පූර්ව වර්ෂ ගැලපීම

මූල්‍ය ඒකකය -රුපියල්

අංකය යොමුව	විස්තරය	ගැලපුම් විස්තරය			2018	1/1/2018 දිනට පෙර ශේෂය	මූල්‍ය තත්ත්වයට බලපෑම
			ප්‍රකාශය	ගැලපීමෙන් පසු			
	Balance b/f				11,318,733.49	(247,886,981.10)	
1.01	2018 වර්ෂයේ DPD/54/18 ව්‍යාපෘතියේ ආදායම් අඩුවෙන් සටහන් වීම	ආදායම	651,000.00	701,000.00	50,000.00		ණය ගැනියෝ වැඩිවීම
		වියදම	661,050.08	661,050.08			
		ශුද්ධ	(10,050.08)	39,949.92			
1.02	2007 වර්ෂයේදී APH/RES/80/17 යටතේ කරන ලද ත්‍රිරෝද රථය සඳහා වන පිරිවැය අත්තිකාරම් ගිණුමකට මාරු කරලීම		1,117,658.30	815,898.30		301,760.00	අත්තිකාරම් ගිණුමේ අගය වැඩිවීම
1.03	දුරකථන ගාස්තු සඳහා අධි වෙන් කරලීම		5,650,889.14	5,521,900.37	128,988.77		ජංගම වගකීම් අඩු වෙනු ඇත.
1.04	ENED/COM/ACT/76/18 සඳහා අධි වෙන් කරලීම	ආදායම	190,887.04	190,887.04			උපචිත වියදම් අඩු වීම
		වියදම	(127,113.07)	(124,613.07)			
		ශුද්ධ	63,773.97	66,273.97	2,500.00		
1.05	CED/COM/73/18 කැගල්ල දිස්ත්‍රික්කයේ පෙරසවි පාලම් ව්‍යාපෘතිය සඳහා සසිරි කොන්ත්රාත් කරුවනට රු.242,533.35 හා සෙවන ගෘහ නිර්මාණ ශිල්පියනට රු.376.26 ක් ද වන අධි වෙන් කරලීම	ආදායම	4,931,145.45	4,931,145.45	-		වියදම් අධිවෙන් කරලීම් නිවැරදි වීම Sasiri - 242,533.35 Sevena 376.26
		වියදම	(5,284,006.61)	(4,121,247.52)	242,909.61		
		ශුද්ධ	(352,861.16)	809.897.93	919849.48		
1.06	RED/C/67/15 - Rehabilitation of Incinerator – Dehiwela Zoo ව්‍යාපෘතියේ වියදම් සඳහා රු.20,992.78 ක් ඌන වෙන්කරලීම	ආදායම	11,765,334.48	11,765,334.48			වියදම් ඌන වෙන්කරලීම නිවැරදි කරලීම
		වියදම	(9,215,575.03)	(9,236,567.81)		(20,992.78)	
		ශුද්ධ	2,549,759.45	2,528,766.67			
1.07	DFCI/COM/75/17 Mineral Sand	ආදායම	552,500.00	552,279.48		(220.52)	කෙරීගෙන යන වැඩ අගය අඩුකරලීම
		වියදම	(287,212.33)	(287,212.33)			
		ශුද්ධ	265,287.67	265,067.15			
1.08	MD/COM/4/118/15	ආදායම	840,948.55	829,521.67		(11,426.88)	කෙරීගෙන යන වැඩ අගය අඩුකරලීම
		වියදම	(784,942.37)	(784,942.37)			
		ශුද්ධ	56,006.18	44,579.30			
1.09	DMS 04/2018 යන වක්‍රලේඛය මත අනිකාල ගණනය කරන ආකාරය වෙනස් වීම	2018	2017	2016			උපචිත වියදම් වැඩිවීම
	ප්‍රකාශිත අගය	3,501,339.05	2,373,245.63	1,940,756.42			
	ගැලපීපෙන් පසු	4,209,012.05	4,346,079.63	3,182,209.42			
	ගැලපීම	707,673.00	1,972,834.00	1,241,453.00	(707,673.00)	(3,214,287.00)	

1.10	2018 වර්ෂයේදී දිරි දීමනා අධි වෙන්කරලීම් රු.1,270,000.00 වන දිරි දීමනා අත්තිකාරම් වැරදි ලෙස 2019 දිරි දීමනා ගිණුමට හරවීම, පරිපාලන අඩුකරලීම් රු.292,037.43 හා අධි වෙන්කරලීම් රු.5866.39 යලි ගැලපීම		2018 18,600,000.00	Corrected 2018 17,032,096.18	1,567,903.82		දිරි දීමනා වෙන්කරලීම් රු. 1,567,903.82 කින් අඩුවනු ඇත.
1.11	ක්ෂය කරලීම් හා සමුච්චිත ක්ෂය කරලීම් සඳහා ඌන ගණනය කරලීම	13,589.04	2012	47,947.93			සමුච්චිත ක්ෂය ඌන /අධි වෙන් කරලීම
	යන්ත්‍රෝපකරණ	(278,400.00)	2016	(277,500.00)			
	පරිගණක	3,176.85	2017	(24,293.14)			
	යටිතල පහසුකම්	46,241.74	2018	17,589.38	17,589.38	(253,845.21)	
	උපකරණ	(20,863.46)					
		(236,255.83)		(236,255.83)			
1.12	එකතු කල අගය මත බදු ගැලපීම 2005-2009 වර්ෂවලදී හිලව් කර ගැනීමට හැකියාවක් නොමැති එකතුකල අගය මත බදු ප්‍රත්‍යාගණන සංචිතයෙන් හිලව් කරලීම	2,184,487.41					CGIR ශේෂය හා ප්‍රත්‍යාගණන සංචිත රු. 5,618,946.07 කින් අඩුවීම
	යන්ත්‍රෝපකරණ	3,169,658.77					
	කාර්යාලීය උපකරණ	157,826.27					
	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	106,973.62					
		5,618,946.07					
1.13	2018 වර්ෂයට පෙර ප්‍රවර්තන වියදම් මත වූ හිලව් කර නොගත හැකි එකතු කල අගය මත බදු ඉදිරියට ගෙන එන ලාභ ශේෂය මත ගැලපීම					(14,853,466.92)	ඉදිරියට ගෙන එන ඌනතාවය රු.14,833,466.92 කින් හා එකතුකල අගය මත රදවාගත් බදු රු.69,644.71 කින් හා රු.9092.40 කින්ද CGIR අයවිය යුතු අගය රු.14,544,729.81 කින් අඩු වීම
1.14	N/MD/COM/04/118/15 අලෙවියට පසු සේවා සඳහා වූ අධි වෙන්කරලීම් ගැලපීම					11,751.66	අලෙවියෙන් පසු සේවා සඳහා වූ රු. 11,751.66 වූ අධිවෙන් කරලීම් අඩු වීම
1.15	2018 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රවාරන වියදම් වල ඌන වෙන්කරලීම් ගැලපීම				(1,473,952.70)		ණය හිමි ශේෂය වැඩි වීම

1.16	වැටුප් වල 2017 වර්ෂයේ ඌන වෙන්කරලීම් නිවැරදි කරලීම. 2017 වර්ෂයේ වැටුප් ඌන වෙන්කරලීම් EPF/ETF ගෙවිය යුතු අගය වැඩිවීම , වාහන ණය අගය අඩුවීම, ගෙවිය යුතු මුද්දර බදු වැඩි වීම					(52,413.68)	41,972 10,416.68 25.00
1.17	E&ESD/COM/51/18 වියාපෘතිය සඳහා 2018 වර්ෂයට ආදායම් හඳුනා ගැනීම ආදායම් වියදම් අතිරික්තය/ ඌනතාවය	Year 2018 470,000.00 16,786.54 453,213.46	Corrected 235,000.00 16,786.54 218,213.46		(235,000.00)		ගණුදෙනුකාර අත්තිකාරම් අගය ඉහල යාම
1.18	ආදායම් බදු ඌන වෙන්කරලීම්				(214,848.46)		CGIR අගය වැඩි වේ
1.19	ඉදිරියට ගෙවූ වියදම් අඩුවෙන් සටහන් වීම වාහන අංකය - 41-2493 301-3740	805.47 (510.52)			294.95		ඉදිරියට කරන ගෙවීම් රු.805.47 කින් හා උපචිත ගෙවීම් රු.510.52 කින් ඉහල යාම
1.20	තැපැල් ගාස්තු සඳහා අධි වෙන්කරලීම 31/12/2018 දිනට මුද්දර තොග ගැලපීම						අතැති මුද්දර තොගය රු. 21,722 කින් ඉහල යනු ඇත.
1.21	මහියංගනය VRC ගොඩනැගිල්ල ඉදිකිරීම	ආදායම වියදම ශුද්ධ	9,694,252.70 (8,729,444.47) 964,808.23	9,581,028.82 (8,729,444.47) 851,584.35	(113,223.88)		කෙරීගෙන යන වැඩ මත ණය ගැතියන් රු.113,223.88 කින් අඩු වීම
1.22	DPD/COM/6-39/2018 නියෝජ්‍ය අමාත්ය නිළ නිවස ප්‍රතිසංස්කරණය	ආදායම වියදම ශුද්ධ	5,049,660.00 (3,742,235.44) 1,307,424.56	4,153,642.41 (3,742,235.44) 411,406.97	(896,017.59)		කෙරීගෙන යනවැඩ මත ණය ගැතියන් රු.896,017.59 කින් අඩුවීම
	එකතුව				**10,629,775.87**	**(265,980,122.43)**	

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2. සුරක්ෂිතයන් ලෙස තබන ලද ඇප තැන්පතු

මූල්‍ය ඒකකය -රුපියල්

ඇපකරය නිකුත් කරන ලද්දේ	ඇප අංකය/දිනය	බැඳුම්කරය	සුරක්ෂිත ලෙස තබා ඇති සහතිකය	සුරක්ෂිතයෙහි වටිනාකම	බැංකුව	ඇප අගය
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	15/2008 12/18/2019-12/17/2020	ඇප තැන්පතු බැඳුම්කරය	C/33734579-507908	100,000.00	ලංකා බැංකුව ජාඇල	75,000.00
නාගරික කොමසාරිස් කුරුණෑගල	10/2017 12/21/2017-12/21/2018	ඇප තැන්පතු බැඳුම්කරය	1057614-81889909 1057615-81889925 1057616-81889906	1,000,000.00 1,000,000.00 1,000,000.00		2,845,000.00
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය	9/2018 12/26/2019-02/16/2020	ඇප තැන්පතු බැඳුම්කරය	1473755-83503832 1473756-83503837 1473757-83503700 1473758-83503765 1473759-83503726 1473760-83503712	1,000,000.00 1,000,000.00 1,000,000.00 1,000,000.00 1,000,000.00 1,000,000.00		5,808,673.47
	7/2018 12/26/2019-02/16/2020	කාර්ය සාධන බැඳුම්කරය	1473754-83503820	1,000,000.00		968,112.24
දේශීය වෛද්‍ය ආයතනය	2019000395 6/1/2019-11/30/2019	කාර්ය සාධන බැඳුම්කරය	1571004-84276128	3,000,000.00		2,588,000.00
සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය අධ්‍යක්ෂ	20190003917 9/5/2019-12/31/2019	ඇප තැන්පතු බැඳුම්කරය Bond	1599884-84754448	2,000,000.00		1,574,795.00
	20190003919 9/24/2019-12/31/2019	කාර්ය සාධන බැඳුම්කරය				393,698.75

3. ස්ථාවර වත්කම් ඉවත්කරලීම

මූල්‍ය ඒකකය -රුපියල්

වත්කම් වර්ගය	පිරිවැය	සමුච්චිත ක්ෂය	ශුද්ධ අගය	විකුණුම් අගය	ලාභය/(අලාභය)
පරිගණක	120,000.00	119,988.80	11.20	1,000.00	988.80
ප්‍රදර්ශන භාණ්ඩ	4,000.00	1,800.00	2,200.00	-	(2,200.00)
උපකරණ	2,138,800.00	962,460.00	1,176,340.00	562.00	(1,175,778.00)
ලීබඩු හා සවිකිරීම්	1,000.00	300.00	700.00	55.00	(645.00)
කාර්යාල උපකරණ	724,000.00	408,833.42	315,166.58	508.58	(314,658.00)
පිරියත හා යන්ත්‍ර	34,000.00	15,300.00	18,700.00	2,750.00	(15,950.00)
මෘදුකාංග	632,000.00	631,936.80	63.20	-	(63.20)
ආයුධ	300,027.93	132,455.74	167,572.19	1,361.25	(166,210.94)
පරිගණක	**3,953,827.93**	**2,273,074.76**	**1,680,753.17**	**6,236.83**	**(1,674,516.34)**

04. ලැබිය යුතු ආදායම් - දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

2005-2009 කාලය සඳහා ප්‍රාග්ධන අයිතමවල වැටි බදු සංරචකය නැවත ඇගයීමේ අතිරික්තය රු.5,618,946.07 ක් වේ. අයකර ගත හැකි පුනරාවර්තන වැටි බද්ද රු. 14,544,729.81 කි. රඳවාගැනීමේ බදු මුදල රු. 239,092.40 ක් වන අතර ගනුදෙනුකරුවන් විසින් ගෙවන ලද වැටි බද්ද රු. 696,644.71 ක් දක්වා ගෙන එනු ලබන්නේ ඉදිරියට ගෙන ආ අතිරික්තය / හිඟයෙනි.

05. තාවකාලික කැඳවුම් තැන්පතු

මධ්‍යස්ථානයේ සේවකයන් විසින් එළෙඹෙන ලද බැදුම්කර, නිශ්චිත බැදුම්කර කාලය ඉක්මයාමට පෙර ආයතනයෙන් ඉවත්ව ඇති විටකදී අයකර ගන්නා ලද මුදල්ය. ඒවා ලංකා බැංකුවෙහි රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලහි තැන්පත් කර ඇත. රු.8,994,089.90 ක අගයෙන් ලාභාංශ හා පොලී අගයෙන් එකතුවෙන් රු.1,500,000.00 ක මුදලක් 1/2017 මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙතින් 2017/07/31 දිනැති චක්‍ර ලේඛණයට අනුව විශේෂ ණය මුදලක් ගෙවීම සඳහා රු.6,000,000.00 201811.15 දින ඉවත් කර ගන්නා ලද්දේ අනුමත පුනරාවර්තන මුදල් නොලැබීම මතය. මෙහි 2019.12.31 වන විට වත්මන් අගය රු.6,676,018.87 ක් වේ.
ගණුදෙනුකරුවන්ගෙන් ලබන වැඩ අත්තිකාරම් අදාල වැඩ වලට උපයෝගී කර ගන්නා තෙක් කැඳවුම් තැන්පතු ලෙස බැංකුවේ තැන්පත් කරනු ඇත.ඉන් ලැබෙන පොලිය අමතර ආදායම් ලෙස දක්වා ඇත.

06. කෙරීගෙන යන වැඩ

කෙරීගෙන යන වැඩ තොග යටතේ පෙන්වා ඇත.

07. අසම්භාව්‍ය වගකීම්

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ප්‍රමිති පුහුණු මූලාකෘති හා පරීක්ෂණ පහසුකම් (STPF) ව්‍යාපෘතිය වෙනුවෙන් පහත සඳහන් මිලදී ගැනීම් සඳහා බැඳි සිටී. මෙම අයිතම සඳහා අරමුදල් සැපයීම් සිදු කෙරෙනුයේ අමාත්‍යාංශයේ අරමුදල් මගිනි.

අයිතමය	ඇණවුම් අංකය	වටිනාකම රු.	සැපයුම්කරු
CNC ලේසර් කටර්	19/SPTE/001	9,056,250.00	M/s CMC Engineering Export GmbH
IP පරීක්ෂණ පහසුකම්	19/SPTE/002	23,441,406.76	M/s Dar E-Com(pvt)Ltd
එකතුව		**32,497,656.76**	

08. සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය

2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාවන්හි පහත දැක්වෙන අනාවරනයන් කරනු ඇත. මෙම මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා මධ්‍යස්ථානයෙහි ප්‍රධාන කළමණාකාරිත්වය හා බැදුනු කිසිදු පාර්ශවයකට යම් ගෙවීමක් කර නොමැත.

08. ප්‍රමිති, පුහුණු මූලාකෘති හා පරීක්ෂණ පහසුකම

දේශීය ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍යවන්නාවූ අධි තාක්ෂණය පදනම් අපනයන වර්ධනය කිරීම සහ දේශීය හා ගෝලීය වශයෙන් බලපත්‍රලත් නිෂ්පාදන සඳහා ස්මාර්ට් මැෂින් සැලසුම් කිරීම තුළින් ආනයන අඩු කිරීමේ අරමුණින් මෙකට්‍රොනික්ස් සක්‍රීය ආර්ථික සංවර්ධන මූලාරම්භයන් (MDEI) පිළිබඳ ව්‍යාපෘතියක් අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත. මෙහිදී නිෂ්පාදන සැලසුම් ඉංජිනේරු උද්‍යානයක් (PDEP) පිහිටුවීමට අදහස් කෙරේ. මෙම ව්‍යාපෘතිය දිගු කාලීන ණය පහසුකම් සැපයීම් (LTLF) සහ හවුල් සේවා ප්‍රමිති , පුහුණු මූලාකෘති හා පරීක්ෂණ පහසුකම් (SPTF) වශයෙන් ප්‍රධාන සංරචක දෙකකි.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන්

මූල්‍ය ඒකකය -රුපියල්

විග්‍රහය	2019	2018
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
ලැබීම්		
ව්‍යාපෘති අදායම	84,744,976.10	67,299,051.08
ප්‍රවර්තන හා පර්යේෂණ ලැබීම්	280,152,034.89	277,620,000.00
පොලිය ලැබීම්	7,806,035.40	8,144,795.21
අනෙකුත් ලැබීම්	3,910,075.80	3,880,026.58
ගෙවීම්		
සේවක පිරිවැය	(230,953,277.83)	(211,469,896.90)
විශ්‍රාම වැටුප්	(22,558,474.50)	(16,533,181.28)
සැපයුම්	(100,872,315.86)	(59,475,692.30)
අනෙකුත් ගෙවීම්	(27,898,326.74)	(25,235,382.09)
බදු	(2,109,482.17)	(2,991,026.96)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	(7,778,754.91)	41,218,693.34
ආයෝජන මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
වත්කම් මිළට ගැනීම්	(39,785,925.17)	(80,818,492.37)
උපකරණ විකුණුම්	6,236.83	12,816.69
ආයෝජන මගින් ඉපැයූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(39,779,688.34)	(80,805,675.68
මූල්‍ය කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	33,543,940.11	34,900,000.00
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	33,543,940.11	43.424.567.15
මුදල් හා සමාන වත්කම් වල (වැඩිවීම/අඩුවීම)	(14,014,503.14)	3,837,584.81
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා සමාන දෑ	140,354,049.19	136.516.464.38
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	126,339,546.05	140.354.049.19

2. **මුදල් නොවන ගණුදෙනු**

(අගය - රුපියල්)

	2019	2018
භාණ්ඩාගාරයෙන් වාහන ලැබීම	-	-
	-	-

3. **මුදල් හා සමාන වත්කම්**

	2019.12.31 දිනට	2018.12.31 දිනට
ජංගම ගිණුම් අංක 404949 ලංකා බැංකුව ජාඇල ශාඛාව	1,506,820.26	607,997.66
ජංගම ගිණුම් අංක 405005 ලංකා බැංකුව ජාඇල ශාඛාව	395,116.77	115,623.98
ජංගම ගිණුම් අංක 404956 ලංකා බැංකුව ජාඇල ශාඛාව	2,969,806.23	2,326,387.03
ජංගම ගිණුම් අංක 1667 ලංකා බැංකුව, ආයතන ශාඛාව	3,862,317.98	1,904,451.84
අතැති මුදල්	3,609,465.94	48,053.57
තාවකාලික කැඳවුම් තැන්පතු - ජාඇල ශාඛාව	62,500,000.00	74,200,000.00
තාවකාලික කැඳවුම් තැන්පතු - ආයතන ශාඛාව	44,820,000.00	55,000,000.00
රාජ්ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල	6,676,,018.87	6,151,535.11
	126,339,546.05	140,354,049.19

12



2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඊසී/බී/එන්ඊආර්ඩීසී/1/19/46 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 23 දින

සභාපති,
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම්

මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මධ්‍යස්ථානය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) ආයතනය විසින් සොයාගන්නා ලද නව උපකරණ සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට දරන ලද වියදම වූ රු.383, 480 ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. එම වත්කම් හි අගය මූල්‍ය ප්‍රකාශන සඳහා හඳුනා ගැනීමේ දී නැවත අගය කිරීමක් කලයුතු වුවත් ඒවා අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ජපන් රජයෙන් පරිත්‍යාගයක් ලෙස පෞද්ගලික ආයතනයකට ලද පානීය ජලය පිරිසිදු කිරීම සඳහා වන උපකරණ 06ක් වරායෙන් නිදහස් කිරීමේ ගාස්තුව වූ රු 359,248 ක් අමාත්‍යාංශයේ උපදෙස් මත මධ්‍යස්ථානය විසින් දරා තිබුණි. 2017 සිදු වූ මෙම ගනුදෙනුව ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් ගත කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

3



විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම්

<u>ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2020 වර්ෂයේ ගිණුම් වලදී අස්පෘශ්‍ය වත්කම් නැවත අගය කිරීමට කටයුතු කරණු ලැබේ.

(ආ) මෙම මුදල් ලැබීමට ඇත්තේ උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය මගිනි. මේ සඳහා ඉල්ලුම් කර ඇතත් අමාත්‍යාංශය විසින් මෙතෙක් ගෙවා නොමැති අතර, ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු යොදනු ඇත.

මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ
සභාපති

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්
අධ්‍යක්ෂ ජනරාල්